

# අධිමාස මණ්ඩලය

# සංඥාපත්‍රය.

—o—

සිංහල නරපතීන්ගේ අභාවයෙන් පසු ලක්දිව් වැසි සමාගම් කීපයේම සඞ්ඝයා අධිමාස සම්බන්ධව නානාමතිකව අධිමාස හැර වස්විසීම කිරීමෙන් මහත් කලබල හටගෙණ වාද භෙදවීමට හෙතුවී පැවැත්ම ලක්දිව් වැස් දනිමිති කාරණා කාරණා දත් කවුරුන්වාගේ දන්නා ඇත්තකි. නමුත් තමතමන් ආශ්‍රයකරණ සථවිරාදීන්ම කුලදෙවියන්මෙන් සලකමින් ඒ ඒ පක්ෂභජනම නිසා සියලු සමාගම්වලම සඞ්ඝයාවහන්සේලාට ඒකාකාරව පිළිපැදිය යුතුවූද ලොකසම්මුතිවශයෙන් ශාස්ත්‍රානුකූලව පවත්නාවූද එනම කාරණය මෙම වර්‍ෂයේම කීපාකාරයකට පවත්නවත්. සියම් බුරුම කම්බෝජාදී රටවලැ සඞ්ඝයාවහන්සේලා රාජාඥා ඇතුව ඒකාකාරයටම මේ වර්‍ෂයේ අධික නොහැර වස් එළඹීම වැල්ගුම්වලින් සහ එරට ලිපිවලිනුත් පත්‍රවලිනුත් දකින්ට අසන්ට ලැබිනිබ්. එසේම විදෙශික ස්වදෙශික ලිත්වලද අධිමාස හැරීමක් නම් වර්‍ෂයට නියමයක් නොමැත්සි. සියම් බුරුම රාමඤ්ඤ රටවලින් පැවිතඑන ලක්දිවැ සඞ්ඝයාවහන්සේලාට ඉහතමෙන් නොව මේ කාලයෙහි ඒ ඒ රටවලැ සඞ්ඝයාවහන්සේලාගේ පැවතුම් සොයා බලා ඊට අනුව පැවැත්ම අවශ්‍යයෙන්ම උචිතනායි. මෙකලද ඒ රටවලැ සඞ්ඝයාවහන්සේලාගේ ගුණප්‍රතිභානියකින් බහුශ්‍රුත භාවයකින් කිසි පාඩුවක් නොමැති හෙයින් මෙරට සඞ්ඝයාට ඒ ගරුසම්භාවනීය මූලස්ථාන නොසලකා හිතුවක්කාරන්ට යුතු නොවේ. ආගම සම්බන්ධ සියලු කටයුතුවල ස්වාමීවූ මූලස්ථාන හැර කරණ හිතුවක්කාරකම ලෞකිකගුණීවනත සියලුගෘහස්ථසමූහයාටම ඒකාකාරවසලකන්ට වටි. එසේසලකා ඇත්තාඇත්ත තේරුම්ගැණීමට එකම උපදෙශය නම්– සියම් බුරුමාදී රටවලැ එන ආකාරයක්ව පැවැත්මමයි. තමතමන්සලකණ ඇත්තන්ගේ කටයුතුම ගරුකොට ගැණීම සියල්ලන්ට ඒකාකාර සාධාරණ කාරණයක්වූ වට යුතුනොවේමය. මේ යුක්තියනොසලකණ උදවිය පක්ෂභජනයෙන්ම ක්‍රියාකරත්. ඒ කෙසේවෙතත් ලොකශාසනයටම සාධාරණව පැමිණෙන ලෙසක් එළිදරව්කිරීම යුතුයයි සලකා මාදම්පේ සිරිවර්ධනාරාමාධිවාසී ආචාර්‍ය ධම්මතිලක සාමිපාදයාණන් වහන්සේ විසින් ශාස්ත්‍රාගම දෙකට ස්වූවනසේ මෙමවර්‍ෂයේ වර්‍ෂාසෘතුව අධිමාසවශයෙන් කඩාහැරීමට යුතුනොවන අනධිමාස වර්‍ෂාසෘතුවබව ශාස්ත්‍රයුක්තිවලින් සහ අධිමාස ප්‍රකාශක ටීකාමතාදියෙන්ද ඉතාසිරවත් කරුණුගෙණ බුරුමරට ඉහත කාලයෙහි පටන් පවත්වා ගෙණ ආ අධිමාස මණ්ඩලක්‍රම සඳ දක්වා කරණලද "අධිමාස මණ්ඩලය" නම් මාහැඟි මේ පොත යුත්ත සලකන්නාවුන්ට ප්‍රයොජන වන බැවින් මාදම්පාගම සැදැහැති භවතුන් කීපදෙනෙකුගේ ආධාරයෙන් නොමිලයේදෙනු සඳහා අච්චුගස්වනට යෙදුනේ,

S, D. S. Jayaratna.
Widane archchi Madanpe.

20–8–06 මාදම්පේදීය.

# ADHIMASA MANDALAYA.

## අධිමාස මණ්ඩලය.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

---

1 සුවිසාරදං ජලනිධිංව ගභීරපඤ්ඤං
සුවිසොධිතං අරියමග්ග වරං මුනීසං,
සිරසාභිවන්දිය සුසං ගමිනං ජිතාරිං
අධිමාස මණ්ඩල නයං විසදීකරිස්සං.

2 පුබ්බෙ පරන්ත විසයෙ පනතම්බදීප-
රට්ඨෙසුභෙ රතනනාම පුරෙසමිද්ධෙ,
යොතෙජසී සිරිසුධම්ම නිධාන සෙට්ඨ
රාජාසිනෙක විජිත්[illegible]සර ධම්මකාමී.

3 සද්ධම්ම කොවිද විසාරද ඤාණධාරී
කිත්තිප්පභා විසර සාසන වුඩ්ඪිකාරී,
සම්පූජිතො නරවරෙහි නිරුපමකාල-
ඞ්කාරොති ථෙර පවරොසි තදා පසත්ථො.

4 සොබොචෙත තිරියපබ්බත මජ්ඣගොපි
ආරඤ්ඤිකො ගුණධනං අභිසඤ්චයානො,
සල්ලෙඛකො ධුතධරො සිවමග්ගමෙසී
වාසං අකාසිච වයෙ පනාසට්ඨිපුණ්ණෙ.

5 ලජ්ජී සුපෙසලයතීහි සුසං යමෙහි
ධම්මානුධම්මපටිපත්ති සුපූරකානං,
සම්පාදිතුං විනයසඞ්ගහනාමගන්ථං
ආරාධිතො තමුපගම්මභිවාදයිත්වා.

6 විනයනයවිච්ඡෙත්ථ සාසනසොපකාරෙ
පියතරවරපාළිමුත්තකෙ දීපිතානි,
පටුතරමතිමාසො නෙකවාදුතිජෙත්වා
වරතර **විනයාලඞ්කාර** ගන්ථං අකාසි.

7 තස්මිං විසෙස තරතොට්ඨිමාසවාදෙ
දීපෙත්ව සො කවිවරො සුවිනිච්ඡයිත්වා,
පච්ඡාත්තනොපිරමිතං විනයානුලොමං
දස්සෙසි සාධුකතරං විජටං කරිත්වා,

8 තස්මිං කුවාදධිකමාස මතානිලඞ්කා–
දීපම්හි කෙචි යතයො පිරතො විගය්හ,
වාදානුවාදපසුතා පරිමුය්හමානා
දීපෙන්ති අත්තමනපෙක්ඛිය කිඤ්චිමත්තං.

9 තස්මාවිවාද මතදීපක පණ්ඩිතස්ස
උප්පත්තිතො පභුති සාසනජොතනත්ථං,
සබ්බං නිරාකුල නයෙන පකාසයිස්සං
භොන්තො විලොකයථිමං අනුසූයමානා.

කෙසේද;

**සර්වමාරචාරණ කෙසරීන්ද්‍රායමානවූ** අපතිලෝගුරු සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජෝත්තමයාණන් වහන්සේගේ පිරිනිවීමෙන් පසු ආඥාචක්‍රවර්තීවූ ශ්‍රී ධර්මාශෝක මහරජතුමන්ගේ සහායත්වයෙන් මොග්ගලිපුත්තතිස්ස මහාස්ථවිරයන්වහන්සේ ප්‍රධානව ෂට්පිළිසිඹියාපත් මහරහතුන් වහන්සේලා තෘතීය ධර්මසංගායනාව කොට නිමවා මතුකාලයෙහි සර්වඥශාසනය චිරකාලයක් මනාව පවත්නා ස්ථානයන් බලා වදාරා උපසම්පදා කර්මයට පොහෝනා සඞ්ඝයා ලක්දිව ආදී දේස නවයකට යවනුවෝ; රාමඤ්ඤ මණ්ඩලය ආදී මණ්ඩල නවයකින් උපලක්ෂිතවූ සූනාපරන්තයයි පුරාණකාලයෙහි ප්‍රසිද්ධවූ අපරන්තරට්ට "ධම්මරක්ඛිත" මහාස්ථවිරයන් වහන්සේ ප්‍රධානව රහතන්වහන්සේලා පිටත්කොට යවා රාමඤ්ඤ මණ්ඩලාදියෙහි සස්න මනාව පිහිටුවා පැවතීඑන අතර පසුකාලයෙහි මහාමහින්ද ස්ථවිර පරම්පරාවෙන් අව්‍යච්ඡින්නව පැවත ආ දිඹුලාගල වැඩවිසූ සාරාර්ථදීපනීනම් මහාටීකාවකළ ශාරීපුත්‍ර මාහිමියන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යයෝවන සිරිසද්ධම්මාලඞ්කාර සිරිසිංහල මහාසාමීයන

ස්ථවිරයන් වහන්සේලා දෙනම වැඩමවා මුම්මමණ්ඩලයෙහි සවිශුද්ධ ශාසනය පිහිටුවා මනාව බැබලවූ ආකාර බුරුම රාජවලියෙන් ගෙණ ශාසනවංශයෙහි මෙසේ පිළිවෙල දක්වාතිබේ.—එනම්—

“කලියුගෙ ඡබ්බීසාධිකෙ සත්තවස්සසතෙ ඵග්ගුණිමාසෙ සත්තිවරාජා රතනාපුරනගරං මාපෙසි” කලියුගවර්ෂයෙහි සවිස්සක් අධිකකොට ඇති සත්සියයක්වූ වර්ෂයෙහි ඵාල්ගුණී(මැදින්දින) මස සත්තිව නම් රජතුමා රතනාපූර නුවර මැවෙවූයේය.

“කලියුගෙ අට්ඨාසීතාධිකෙ සත්තවස්සසතෙ නරපතිරඤ්ඤො ධීතාය සද්ධිං ලොකචක්ඛුස්ස රඤ්ඤො පුත්තො ආනන්ද සූරියො නාම සංවාසං කත්වා එකං සම්බිකං නාමපුත්තං විජායි, සො වයප්පත්තො රජ්ජසම්පත්තිං ලභි,” කලියුගවර්ෂයෙහි අසූඅටක් අධිකකොට ඇති සත්සියයවන වර්ෂයෙහි ලොකචක්ඛු රජහුගේ පුත්‍රවූ ආනන්ද සූරිය නම් කුමාරතෙම නරපතිරජුගේ දුහිතෘව සමග සන්වාසයකොට සම්බිකනම් එක් පුත්‍රයෙක් ප්‍රසූතකෙළේය– හේතෙමේ (රජවියයුතු) වයසට පැමිණිකල්හි රාජ්‍ය සම්පත ලැබුවේය.

“තතො පච්ඡා සිරිසුධම්ම රාජාධිපතීති ලද්ධනාමො සත්තිව රාජා රතනාපුරනගරෙ රජ්ජං කාරෙසි– තස්ස රඤ්ඤො කාලෙ කලියුගෙ එකනවුතාධිකෙ සත්තවස්සසතෙ සම්පත්තො ලඞ්කාදීපතො සිරිසද්ධම්මාලඞ්කාර ථෙරො සිරිසීහල මහාසාමිථෙරො චාති ඉමෙ ද්වෙථෙරා පඤ්චසරීරධාතුයො ආනෙත්වා නාවාය කුසීමතිත්ථං පාපුණිත්වා රාමඤ්ඤරට්ඨෙ බඤ්ඤරනනාමෙ නරඤ්ඤො නිවාරිතා අනිසීදිත්වා තතොසොයෙව රාජා ථෙරෙ සිරිඛෙත්තනගරා පහිනි. තම්පවත්තිං සුත්වා රතනාපූරින්දු රාජා චත්තාලීසානි නාවායො යාව සිරිඛෙත්තනගරං පච්චුග්ගන්ත්වා ආනෙසි ආනෙත්වා ච පන මහන්තං වා ගාමං පත්තකාලෙ සහ ඔරොධෙහි අමච්චෙහි ච සයමෙව රාජා පච්චුග්ගඤ්ජි— රතනාපූරං පන පත්තකාලෙ මහා පඨවීචලි— පඨනාදඤ්ච අදි— තදා රාජා සම්මාසම්බුද්ධස්ස තිලොකග්ගස්ස සාසනං පග්ගණ්හිස්සාමීති චින්තෙත්වා සරීරධාතුං ආනෙත්වා ඉධ පත්තකාලෙ අයංමහාපඨවී චලති– පඨනාදඤ්ච අදති– ඉදං අම්හාකං රට්ඨෙ ජිනසාසනස්ස චිරකාලං පතිට්ඨානභාවෙ පුබ්බනිමිත්තානි සයමෙව නිමිත්තපාඨං අකාසි තාවතිට්ඨතු ජීවමානස්ස සම්මාසම්බුද්ධස්ස ආනුභාවො, අභාවිත සරීරධාතුයා යෙව ආනුභාවොති ඉන්නුරට්ඨවාසිනො පසීදිංසු.

හොන්ති චෙත්ථ,

සරීරධාතුයාතාව මහතෙතාවිශරීසොහොති
කාකටාපනබුඩසස ජීවමානසසසෙඨසස,
එවං අනුසසරිතවාන උපපාදෙය්‍යපසාදකං
බුඩගුණෙසු බාහුල්ලං ගාරවඤ්ච කරෙ ජනොති.

කලියුගෙ චෙතවුතාධිකෙ සහසවසසසතෙ තා පඤ්ඩධාතුයො නිදහිතවා ජෙය්‍යපුරනගරතො පචඡිමදිසාභාගෙ සම්භූමිභාගෙ චෙතියං පතිඨාපෙසි. තං චෙතියං රතනචෙත්ති පඤ්ඤායෙපසි– ශුභතිරජපබාහුල්ලතාය අනෙකි හිදෙසු පාකටං අහොසි– තීණි සිරි ගුණෙබෙහෙනි සතතසිවාරෙහිච අලංකතං උම්මගගංනාම මහාවිහාරං කාරාපෙතවා විනතං සීහළිකථෙරානං අදාසි— තතොපචඡා තෙසු මහනතථෙරා සතවිහාර සමීපෙ පබබතමුඩනි අනනෙතාසිසෙසසපි අපචෙතසතවා ලජ්ජිපෙසල බහුසසුත සිකඛාකාමෙහි සදධිහිතෙබහි තිහිථෙරෙහි සඩිං සීමං සම්මනනති, ඉච්චෙවං සීමාසම්මුතිපරියුතති චාවතාදි කාමෙමහි මරමමරටෙඨ සාසනං විරූළහං කත්වා පතිඨාපෙසි,– ඉදං මරමම මණඩලෙ රතනාපුරනගරෙ සීහළදීපිකෙ චෙ ථෙර පටිචච පඨමං සාසනසස පතිටඨානං.

ඉන්පසු සිරිසුධම්ම රාජාධිපතියයි ලබනලද නම් ඇති සුතනිවනම් රජෙක් රාජ්‍යය කෙරෙව්යේය. ඒරජුගේ කාලයෙහි කලියුගවර්ෂයෙහි එක් අනූවක් අධිකකොට ඇති සත්සියයවන වර්ෂය පැමිණිකල්හි ලක්දිවින් සිරිසධම්මාලඞකාර සථවිරතෙමේද සිරිසීහල මහාසථවිර තෙමේද, යන මේ සථවිරදෙනම ශාරීරිකධාතු පස්නමක් රැගෙණ නැවින් (කුසිම මණ්ඩලයෙහි) කුසීමනම් තොටට පැමිණ රාමඤ්ඤරටෙහි බෘංඤ්ඤ, නම් රජහුවිසින් නැත්වනලදුව නොනැවති ඒ නුවරින් ඒ රජතෙමේ යම්තාක් සිරිඛෙත්තනුවර දක්වා හැරියේය. රතනාපුර නගරන්දුවූ රජතෙමේ ඒ කාරණය දැන නැව් සතළිසක් සමග යම්තාක් සිරිඛෙත්තනුවරද ඒතාක් පසුගමන්කොට වැඩමවාආයේය. වැඩමවාවූත්ද මහණව ගමට පැමිණිකල්හි ඇතුළුනුවර ඇමතියන්ද සමග රජතෙමේ තෙමේම පසුගමන්කෙළේය. රතණනම් නුවරට පැමිණිකල්හි මහාපෘථිවිය කම්පාවූයේය පතිරාවය කෙළේය එකල්හි රජතෙමේ මෙතුලොනාත සම්‍යක්සම්බුද්ධරජාණන් වහන්සේගේ සත්‍ය දැකීකොට ගන්නෙමියි සිතා ශාරීරිකධාතු ගෙණ මෙහි පැමිණිකල්හි මහාපෘථිවිය චලනයවූයේය. ප්‍රතිරාවයකෙළේයසිද. මේ අපගේ

ජ්‍යෙටෙහි සර්වඥශාසනයාගේ බොහෝකල් පිහිටීම් බවෙහි පූර්වනිමිත්තායයි තෙමේම නිමිත්ත තේරූයේය. ජීවමානවූ සම්‍යක්සම්බුද්ධරජාණන්වහන්සේගේ ආනුභාවය ඒතාක් සිටීවා. ශාරීරිකධාතුවගේ ආනුභාවය ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයයි බොහෝරටවාසීහු පැහැදුනාහුය—මෙහි එය පහලවෙන්මය.—

ශාරීරික ධාතූන්වහන්සේගේ මහත්වූ අශ්චර්‍ය්‍යය ඒතාක් වෙයි. ජීවමානවූ ශ්‍රේෂ්ඨවූ බුදුරජානන්වහන්සේගේ ආනුභාවය කියනුම කවරේද; මෙසේ බුදුරජානන්වහන්සේ සිහිකොට බුදුරජාණන්වහන්සේ කෙරෙහි පැහැදීම උපදවන්නේය. ජනතෙමේ බුද්ධගුණයෙහි බහුලකොට ගෞරවකරන්නේය.

කලියුගවර්ෂයෙහි දෙයානුවක් අධිකකොට ඇති සත්සියය වූ වර්ෂයෙහි සර්වඥධාතූන් පස්නම නිධානකොට ජේත්‍යපුර නුවර පශ්චිමදිසාභාගයෙහි සම්වූ භූමිප්‍රදේශයෙක චෛත්‍යය පිහිටවූයේය. ඒ සෑයටද රතනචෛත්‍යයයි නමතැබූයේය. ඈත්රූ බහුලබැවින් අංග කිහිඤයයිද ප්‍රකටවූයේය. සිරිගෑහ තුනකින් හා දොරකඩ සතකින්ද අලංකෘතව උම්මගගන නම මහාවිහාරයක් කරවා සිංහලද්වීපයෙන් ස්ථවිර දෙනම්බ දූත්තේය.

ඉන්පසු ඒ ස්ථවිරදෙනමගෙන් මහාස්ථවිරතෙමේ තමන්වහන්සේගේ විහාරය සමීපයෙහි ශිලාපර්වතය මස්තකයෙහි තමන්වහන්සේගේ ශිෂ්‍යයන්ද ඇතුලත්කොට තෝරාගෙණ ඇඳුගියයුතු ලජ්ජීපෙසල ශික්ෂාකාමී ස්ථවිර තුන්නමක් සමඟපස්නම සීමාව සම්මතකෙළේය.

මෙසේ සීමාබන්ධන පස්ෂපතිධර්මය කියවීමාදී කර්මවලින් බුරුමරට සස්න වැඩීමකොට පිහිටෙව්වේය, මේ බුරුම මණ්ඩලයෙහි රතනාපුර නුවර සිංහලද්වීපයෙහි ස්ථවිරදෙදෙනාවහන්සා පළමුකොට සස්නයගේ පිහිටුවීමය.

“කලියුගෙ චතුවස්සාධිකෙ අට්ඨවස්සසතෙ මහානරපති රාජා රතනාපුරනගරෙ රජ්ජංකාරෙසි”

කලියුගවර්ෂයෙහි වර්ෂ සතරක් අධිකකොටඇති අටසියය වන වර්ෂයෙහි මහානරපති රජතෙමේ රතනාපුරනුවර රාජ්‍යය කෙරෙව්යේය.

“කලියුගෙ චෙවත්තාළීසාධිකෙ අට්ඨවස්සසතෙ සම්පත්තො රතනාපුරනගරෙව සිරිසුධම්මරාජාධිපතිනාම දූත්‍යාධික රාජා රජ්ජංකාරෙසි”

කලියුගවර්ෂයෙහි සතළිස්දෙකක් අධිකකොටඇති අටසියස් ස වන වර්ෂය පැමිණි කල්හි රත්නාපුරනුවරෙහිම සිරිසුධම්මරාජාධිපතිනම්වූ දෙවෙනි අධිකරජ රාජ්ජ්‍යය කෙරෙව්යේය.

"කලියුගස්සගතෙ සට්ඨ්‍යාධිකෙ අට්ඨවස්සසතෙ රත්නාපුර නගරෙයෙව සිරිතිහුවනාදිත්‍ය නරපතිවරො ධම්මරාජාධිපති රාජා රජ්ජංකාරෙසි"

කලියුගවර්ෂයාගේ සැටවසක් අධිකකොටඇති අටසියය වන වර්ෂය ඉක්මුනුකල්හි රත්නාපුර නුවරෙහිම සිරිතිහුවනාදිත්‍ය නරපතිවරධම්රාජාධිපති රජතෙමේ රාජ්ජය කෙරෙව්යේය.

"අථපච්ඡිමරම්මරට්ඨං කලියුගස්ස පඤ්චාසීතාධික අට්ඨසතකාලතොපට්ඨාය යාවඅට්ඨාසීතාධික අට්ඨසතවස්සකාලං නානාභයෙහි සංඛුභිතං අහොසි"

නැවතද කලියුගවර්ෂයාගේ අසූපසක් අධිකකොට ඇති අටසියයවන කාලයපටන් යම්තාක් අටසිය අසූඅටක් කල් බුරුම රට නොයෙක් භයින් චංචලවූයේය.

"කලියුගෙ එකසට්ඨ්‍යාධිකෙ නවවස්සසතෙ සම්පත්තෙ ඵග්ගුණමාසස්ස ජුණ්හපක්ඛදුතියදිවසෙ සුක්කවාරෙ රත්නාපුර නගරං දුතියං මාපෙත්වා සේද්ධරාම් නාමරාජා රජ්ජංකාරෙසි" සූරධම්මාතිපි නාමලඤ්ජං පටිගණ්හි.

කලියුගවර්ෂයෙහි එක්සැටක් අධිකකොට ඇති නවසියය වන වර්ෂය පැමිණිකල්හි ඵාල්ගුණ් (මැදින) මස ශුක්ලපක්ෂයේ දෙවෙනි තිථිදින රත්නාපුරනුවර දෙවෙනිවර මවා සේද්ධරාම් නම් රජු රාජ්ජය කෙරෙව්යේය— සූරධර්මයයිදු නාමලාඤ්ජය පිළිගත්තේය.

"කලියුගෙ සත්තසට්ඨ්‍යාධිකෙ නවවස්සසතෙ ඵග්ගුණමාසස්ස කාලපක්ඛ තෙරසමියං තස්ස ජෙට්ඨපුත්තො පිතුසන්තකං රජ්ජං ගණ්හි— මහාධම්මරාජාති නාමලඤ්ජම්පි පග්ගණ්හි"–

කලියුගවර්ෂයෙහි සැටසතක් අධිකකොටඇති නවසියයෙ වන වර්ෂයෙහි ඵාල්ගුණ් (මැදින) මස කාලපක්ෂ තෙලෙස්වක්දින ඒ රජුගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රතෙමේ පියරජුසන්තක රාජ්ජ්‍යය පිළිගත්තේයි— මහාධර්මරජුයයි නාමලාඤ්ඡයද පිළිගත්තේය.

"කලියුගෙ තිසත්තතාධිකෙ නවවස්සසතෙ සම්පත්තෙ මහාමුනිචෙතියස්ස පුරත්ථිමදිසාභාගෙ චතුතාරෙ විහාරෙ කාරාපෙත්වා චතුන්නං ථෙරානං අදාසි— තෙච ථෙරා තත්ථ නිසීදිත්වා

සාසනං පග්ගණ්හිංසු– තස්මිං යෙව කාලෙ බදරවනවාසී නාම එකොපි ථෙරො අත්ථි– සොපි පරියත්ති විසාරදො ඡපදවංසිකො– සො ච ථෙරො යාවජීවං යථාබලං සාසනං පග්ගණ්හිත්වා දුතියභවෙ චලඞ්ග නගරෙ එකිස්සා ඉත්ථියා කුච්ඡිම්හි පටිසන්ධිං ගණ්හි දසමාසච්චයෙන කලියුගෙ චත්තාලීසාධිකෙ නවවස්සසතෙ සම්පත්තෙ බුධවාරෙ විජායිත්වා තෙරසවස්සිකකාලෙ සාසනෙ පබ්බජිත්වා පරියත්තිං උග්ගණ්හි– සිරිඛෙත්තනගරින්දෝ රාජා සිරිඛෙත්තනගරං ආනෙත්වා සිරිඛෙත්තනගරෙ සාමණෙරොති පාකටො හුත්වා කලියුගෙ චතුපඤ්ඤාසාධිකෙ වස්සසතෙ සම්පත්තෙ පණ්ණරසවස්සිකකාලෙ වෙස්සන්තරජාතකං කබ්බාලඞ්කාරවසෙන බන්ධි– පරිපුණ්ණවීසතිවස්සකාලෙ සිරිඛෙත්තනගරෙයෙව සිරිඛෙත්තනගරින්දෙන වෙරවිජයො නාමරාජා අනුග්ගහෙත්වා උපසම්පදභූමියං පතිට්ඨාසි– පච්ඡිමපක්ඛාධිකො නාමරාජා සිරිඛෙත්තනගරං අත්තනො හත්ථගතං අකාසි– තස්මිං ච කාලෙ තං ථෙරං ආනෙත්වා රතනපූරනගරෙ වසාපෙසි– සූරකිත්ති නාම රඤ්ඤො කනිට්ඨභාතා එරාවතී නදීතීරෙ චතුභූමිකවිහාරං කාරාපෙත්වා තස්ස ථෙරස්ස අදාසි– රාජා ච තිපිටකාලඞ්කාරොති නාමලඤ්ජං අදාසි– කලියුගෙ වස්සසහස්සෙ සම්පත්තෙ ඵග්ගුණමාසස්ස පුණ්ණමියං සට්ඨිවස්සිකො හුත්වා තිරියපබ්බතං ගන්ත්වා අරඤ්ඤවාසං වසි චෙවස්සාධිකෙ වස්සසහස්සෙ රාජා තස්මිං විහාරං කාරාපෙත්වා තස්සෙව ථෙරස්ස අදාසි– සොපන තිපිටකාලඞ්කාර ථෙරො සිරිඛෙත්තනගරෙ නවඞ්ගකන්දරෙ පත්තාලඞ්කාරස්ස අතුලවංස ථෙරස්ස වංසිකො සිරිඛෙත්තනගරෙ නවඞ්ගකන්දරෙ සුවණ්ණවිහාරෙ වසන්තස්ස තස්ස ථෙරස්ස ඤාතිකො සො පට්ඨි– ජෙය්‍යපුරෙ එරාවතී නදීතීරෙ වසනකාලෙ අට්ඨසාලිනියා ආදිතො විසතිගාථානං සංවණ්ණනං අකාසි– සූරකන්ත නාමකස්ස කනිට්ඨභාතිකස්ස යාචන මාරබ්භ යසවඩ්ඪනවත්ථුම අකාසි– තිරිය පබ්බතෙ වසනකාලෙ විනයාලඞ්කාර ටීකං අකාසි"

කලියුග වර්ෂයෙහි සැත්තෑතුණක් අධිකකොට ඇති නවසීයය වන වර්ෂය පැමිණි කල්හි මහාමුනි චෛත්‍යයට පූර්විදිග්භාගයෙහි විහාර සතරක් කරවා (ඉහතින් දක්වනලද) මණිකුණ්ඩල කථා වස්තුව ධූරුමඝාණවට නැගූ වරාභිසඞ්ඝනායක ස්ථවිරයන්ද සපතරාජ ධම්මවස්තුව නමින් පොතක්කළ ස්ථවිරයන්ද රාමඤ්ඤරටින් පැමිණිසිටි වෙදග්‍රන්ථයන්හි දක්ෂ ස්ථවිර දෙනමක්ද යන සතරනමට පුදකෙළේය. ඒ ස්ථවිරවරුද එහි වැඩහිඳ සස්න දැඩිකොට ගෙණ විසූහ, ඒ කාලයෙහිම දෙබරවනවාසී නම් එක් ස්ථවිර

කෙනෙක්ද ඇතිවූයේය. ඒ සථවිරතෙමේද පයර්‍යාප්ති ධර්මයෙහි විශාරදවූ ත්‍රිපිටකවාගීශ්වරයෙක්ය. ඒ සථවිරතෙමේද දිව්‍යකෙළවරදක්වා යම්සේ ශක්තිආකාර සස්න දූඩිකොටගෙණ දෙවෙනි භවයෙහි දවැඩගනම් නුවරෙහි එක් ස්ත්‍රියකගේ කුක්ෂියෙහි පිළිසිඳගත්තේය. දසමසකගේ ඇවෑමෙන් කලියුග වර්ෂයෙහි සතළිසක් අධිකකොට ඇති නවසියයවන වර්ෂය පැමිණිකල්හි බුද්ධදින ප්‍රසූතකොට තෙළෙස් හැවිරිදිකල්හි සස්නෙහි පැවිදිව පයර්‍යාප්තිය උද්ග්‍රහණය කෙළේය. සිරිබෙතනුවර ප්‍රධාන රජතෙමේ (ඒ පැවිදි තැන්) සිරිබෙතනුවරට කැඳවාවුත් සිරිබෙතනුවර හෙරණයයි ප්‍රකටව කලියුග වර්ෂයෙහි සිව්පණසක් අධිකකොටඇති නවසියයවන වර්ෂය පැමිණිකල්හි පසළොස් වයස් කාලයෙහි වෙස්සන්තර ජාතකය කාව්‍යාලඞ්කාරවශයෙන් පද්‍යබන්ධනකෙළේය. විසිවයස් පිරුණුකල්හි සිරිබෙතනුවරෙහි සිරිබෙතනුවරට ශ්‍රේෂ්ඨවූ වෙරවිජයනම් රජතෙමේ අනුග්‍රහකොට උපසම්පදා භූමියෙහි පිහිටියේය. පච්ඡිමපක්ඛාධිකනම් රජතෙමේ සිරිබෙතනුවර හසනගත කෙළේය. එකල්හිද ඒ සථවිරයන් කැඳවාගෙණවුත් රතනපුරනුවරෙහිම වැසවූයේය. සූරකිත්තිනම් රජුගේ බාල සොහොවුරු කුමාරතෙමේ එරාවතී ගඞ්ගාතීරයෙහි ශිවකීම් (සතරමහල්) විහාරයක්කරවා ඒ සථවිරයන්ට දුන්නේය. රජතෙමේද තිපිටකාලඞ්කාරය යන නාමයද දුන්නේය. කලියුගවර්ෂයෙහි අවුරුදු දහස පැමිණිකල්හි සැටවියස්ව ඵාල්ගුණීමසගේ (මැදින්දින) පුණු පොහෝදිනයෙහි තිරිශතම්පත්වට වැඩ ආරණ්‍යවාසයෙන් විසූයේය. කලියුගවර්ෂයෙන් එක්දහස් දෙවෙනි වර්ෂයෙහි රජතෙමේ ඒ පර්වතයෙහි විහාරයක් කරවා එම සථවිරයන්ට දුන්නේය. ඒ තිපිටකාලඞ්කාර සථවිරතෙමේ වනාහි ලක්දිවින් පැමිණි සිරිබෙතනුවර නවඞ්ග කඳුරැලියෙහි සිටි අතුලවංශ සථවිරයන්ගේ වංශයෙහි කෙනෙක්ය. සිරිබෙතනුවර නවඞ්ගකඳුරැලියෙහි සුවර්ණ විහාරයෙහි වසනකල්හි ඒ තෙරුන්ගේ කීර්තිඝෝෂාව පැතුරුණේය. ජේය්‍යනම් නුවර එරාවතීනම් ගඞ්ගාතීරයෙහි වැඩවාසයකරණ කාලයෙහි අට්ඨසාලිනියෙහි මූලගාථාවිස්සකට අර්ථවර්ණනාවද කෙළේය. සූරකන්තනම් බාලභාතෘවගේ ආරාධනාවනිසා යසවඩ්ඪනනම් කථාවස්තුවද කෙළේය. තිරියපබ්බෙහි වැඩවාසයකරණ කාලයෙහි විනයාලඞ්කාර ටීකාවකෙළේය.

(ප්‍රථම භාගය.)

මේ ස්ථවිරයන්වහන්සේ විසින් කරණලද ඒ විනයාලඞ්කාර ටීකාවේ අධිමාස විනිශ්චයෙහි—

“අලමතිපපඤ්චෙන අත්ථිකෙහි තිවස්සාධික සහස්ස කලියුගෙ ධම්මරාජේන පුච්ඡිතත්තා කතං අධිමාසපකරණං ඔලොකෙත්වා ජානිතබ්බං ඉධපන අධිප්පෙත විනිච්ඡයමෙව කථයාම” යනුවෙන් ඉතා ප්‍රමාදවීමෙන් කම්නැත. වැඩඇත්තවුන් විසින් (මහා)ධර්මරජහු විසින් විචාරණලද බැවින් වර්ෂ තුණක් අධිකකොට ඇති දහසක්වන කලියුග වර්ෂයෙහි කරණලද අධිමාස ප්‍රකරණය බලා දැනගතයුතුය— මෙහි වනාහි අභිප්‍රාකූරණලද විනිශ්චයම කියම්හයි- විනිශ්චයට පටන්ගෙණ.

“පඨමදුතියවාදෙසු නබිම්බිසාර රාජා භගවන්තං අධිමාස පඤ්ඤාපනං යාචති- නචභගවාපඤ්ඤපෙති න තස්මිං වස්සෙ ඉදං නාම අධිමාසං හොතීතිවා මාසමත්තංවා ආකඞ්ඛිතබ්බන්තිවා පාළියං අට්ඨකථා ටීකාසුචඅත්ථි- රාජා පන උපකට්ඨාය වස්සූපනායිකාය වේදසමයෙ වස්සුක්කඩ්ඪන සම්භවතො භික්ඛූනං පඨමාසාළ්හිමාසෙ වස්සං අනුපගන්ත්වා දුතියාසාළ්හිමාසෙ උපගමනත්ථං යදිපනායස්මා ආගමෙ ජුණ්හෙ වස්සං උපගච්ඡෙය්‍යුන්ති දූතං පාහෙසි— යදිපන උපගච්ඡෙය්‍යුං, සාධුවතස්සාති සම්බන්ධිතබ්බං— භික්ඛුපනරඤ්ඤ පහිතිතසාසනං භගවතො ආරොචෙසුං- භගවාපන වස්සුක්කඩ්ඪනෙ භික්ඛූනං ගුණපරිහානියා අභාවතො අනුජානාමි භික්ඛවෙ රාජූනං අනුවත්තිතුන්ති අවොච- තෙනවුත්තං අට්ඨකථායං “අනුජානාමි භික්ඛවෙ රාජූනං අනුවත්තිතුන්ති”-එත්ථ වස්සුක්කඩ්ඪනෙ භික්ඛූනං කාචිපරිහානිනාම නත්ථීති- “අනුවත්තිතුන්ති”, අනුඤ්ඤාතන්ති විමතිවිනොදනියම්පිවුත්තං— “පරිහානීති” ගුණපරිහානි”

යනුවෙන් ප්‍රථමද්විතීයවාදයන්හි බිම්සර රජතෙම අධිමාස පැණවීමට භාග්‍යවතුන්වහන්සේට යාඥනොකළේය. භාග්‍යවතුන්වහන්සේ අධිමාස නොපැණවූයේය. ඒ වර්ෂයෙහි මෙනම් අධිමාසයවේයයි හෝ මාසය පමණක් ආකාංෂණය කටයුතුයයි හෝ පෙළ අටුවා ටීකාවන්හිද නොමඇත්තාහුය. රජතෙමේ වනාහි වස් එළඹීම පැමිණිකල්හි වෙදගමෙහි වස්සුක්කඩ්ඪනයකිරීම ඇතිවනා හෙයින් ප්‍රථම ආෂාඪමාසයෙහි වස්නොඑළඹ විතීයා ෂාඪමාසයෙහි වස් එළඹීමපිණිස ආයුෂ්මත්වහන්සේලා එනපසළොස්වකට වස්එළඹෙන්නාහු නම් මැනවැයි භික්ෂූන්ගේ සමීපයට දූතයෙක් යවූයේය. ඉදින් වනාහි එසේ වස්එළඹෙන්නාහු නම් ඒකාන්තයෙන් මැනවැයි කියා සම්බන්ධකටයුතුය. භික්ෂූනුවනාහි රජහුවිසින් එවනලද අස්නු

භාග්‍යවතුන්වහන්සේට සැලකළාහුය. භාග්‍යවත්තෙමේ වස්සුක්කඩ්ඪනයෙහි භික්ෂූන්ගේ ගුණ පිරිහීමක් නොවනා හෙයින් මහණෙනි රජුන්ට අනුව පවතින්ට අනුදනිමියි වදාළේය, එහෙයින් මහණෙනි රජුන්ට අනුව පවතින්ට අනුදනිමියි අටුවාවෙහි කියන ලදී. මෙහි වස්සුක්කඩ්ඪනයෙහි භික්ෂූන්ට කිසි පිරිහීමක් නැතියයි අනුව පවතින්ට අනුදන්නාලදයයි විමතිවිනොදනියෙහි කියන ලදය. පිරිහීමය යනු- ගුණපිරිහීමය.

යනාදීන් දක්වා විනයාලඞ්කාරයෙහි තිපෙටකාලඞ්කාර තෙරුන්වහන්සේ විවාදමත තීරණයකිරීමෙන් දක්වාතිබෙන්නේ ආෂාඪමයක් පැමිණි වර්ෂයෙහි වෙදගමෙහිද වස්සුක්කඩ්ඪනය ක්‍රණනිසා බිම්සර රජුගේ දන්වීම අරමුණුකොටගෙණ ප්‍රථමාෂාඪය හැර පශ්චිමාෂාඪයෙහි වස් විසීමෙන් සීලගුණ පිරිහීමක් නොවනා බැවිනි. රාජානුවත්තනකව පශ්චිමාෂාඪයෙහි වස්විසීමට වදාළ පමණමුත් ද්විරාෂාඪ රහිත වර්ෂයන්හි වස්සුක්කඩ්ඪනයක් නොවදාළ බවින් මෙනම් අධිමාසයෙහි වස්සුක්කඩ්ඪනය කටයුතුයයි නොවදාළබවත් පමණකි— මේ ශ්‍රෙයාර්ථයයි- නීතාර්ථවසයෙන් විත් අනධිමාස වර්ෂයන්හි වස්සුක්කඩ්ඪනයක් කරන්ට කිසිසේත් නොපැණෙන්නේය. ආෂාඪමයක් පැමිණි එම වර්ෂයෙහි ප්‍රථමාෂාඪයහැර ද්විතීයාෂාඪයෙහි වස්එළඹෙන්නාහුනම් මැනවැයි දන්වා යැවූ මේ යුක්තිය සලකා බලනවිට අනධිමාස වර්ෂයන්හි සූත්‍රානුලෝමයකටත් ඇතුලත්නොවන අශාසනික වස්සුක්කඩ්ඪනයන් කිරීම ගුණ පරිහානියට ඒකාන්ත හෙතු කරුණුවීම නියතයි. "විපඩ්ඪ" යනාදීන් මණ්ඩලූකොට බෙදගැණීමෙන් ප්‍රාපතාධි මාසහැරීමේ ප්‍රයෝජනවාර උනුතිරිනොවී චාතුද්දසී පෝණිමි උපොසථයන් මනාව ලැබීමය. දසාධි මාස අධාරසාධිමාස දෙක්හි වාරශෂනොවී චාතුද්දසී පෝණිමිලැබේ. බිම්සර රජතුමාගේ දන්වීම සලකා පශ්චිමාෂාඪයෙහි වස් එළඹෙන්ට අනුදනවදාළ වර්ෂය අනධිමාස වර්ෂයක් නොවනාබව "පඨමාසාළ්හිමාසෙ වස්සං අනුපගන්ත්වා දුතියාසාළ්හිමාසෙ" යනාදියෙන් පැහැදිලිව පැණේ.

සාවාධිමාසය අනධිමාස වර්ෂයකට සලකාගැන්ම මේ රජතුමාගේ දන්වීමක් ලෙසට සලකාගණිතත් අර්ථකථා ටීකාවන්හි සාවාධි මාසක්‍රමයක් කිසිතැනක නාහෙයින්නුත් විනයාලඞ්කාරය කරණ කාලයෙහි බුරුමරට සමහර යතිවරු උපදවාතිබුණු වාද බව එම පොතේ වාද විනිශ්චයාරම්භයෙහි "ඉමස්මිං වස්සූපනායික විසයෙ තෙසුතෙසු නගරෙසු තස්මිං තස්මිං රාජකාලෙ පරියන්තා විවාදකථා හොති- වෙදසමයෙන සංසන්දිත්වා ගය්හමානා අනෙක

විහිතං විවාදං කරොන්ති- වෙදසමයෙකිර වෙ අධිමාසනි යාචායි මාසඤ්ච පතනාධිමාසඤ්ච" යනාදියෙන්ද— එකංචෙච්චවදන්ති අඤ්ඤෙඤ්ඤවදන්ති" යන වර්තමාන ප්‍රථමපුරුෂ බහුවචනවලින්ද තෙරුන්වහන්සේ පිළිනොගත් පරවාදබව අතැඹුලක්සේ ප්‍රකාශයි. යම් වාදයක් විනිශ්චයකරණාතන්හි වාදමත පළමුකොට දැක්වීම විදග්ධයන්ගේ චාරිත්‍රධර්මයකි.

මෙහිද ග්‍රන්ථකර්තෘත්වහන්සේ වාදමත පළමුකොට දක්වා සූත්‍ර සූත්‍රානුලෝම දෙක දැක්වීමෙන් "තත්‍රායං පිණ්ඩත්ථො ආසාළ්හියා පුණ්ණමියා අනන්තරෙ පාටිපද දිවසෙ පුරිමිකා උපගන්තබ්බා- සාවණපුණ්ණමියා අනන්තරෙ පාටිපදදිවසෙ පච්ඡිමිකා උපගන්තබ්බාති" යනුවෙන් විසමනොවන වර්ෂවල පෙර පසු වස්දෙක එළඹීමට දක්වා සෘතු විසම වර්ෂයන්හි අධිමාස හැරීමට කරුණු දක්වනුවෝ. "තිථිනක්ඛත්තයොගෙන උපොසථ දිවසෙසු බහුධාපිටකත්තයෙ ආගතො— පොරාණ වෙදගන්ථෙසුච පසංසිතො— කදාචි පන භායනකාලොතිථියා- නක්ඛත්තානච විසමොහොති, තස්මාතං සමෙතුං අධිමාසපතනකාලෙ මාසම්පි දිවසම්පි ආකඩ්ඪිතබ්බං—තස්මා අඤ්ඤස්මිං කාලෙ විසමෙපි ආකඩ්ඪනකාලෙ සමංපෙතබ්බං-* එවං සතිමාස උතුසංවච්ඡරානං සමභාවො හොතීති දට්ඨබ්බං" තිථි නක්ෂත්‍රයන්ගේ යෙදීම්තොරම් වනාහි උපෝසථ දිනයෙහිම බොහෝ ප්‍රකාරයෙන් පිටකත්‍රයෙහි ආයේය. පෞරාණික වේදග්‍රන්ථයන්හිද (එය) ප්‍රශංසාකරණලද්දේය. යම් කලෙක්හි වනාහි සංවත්සරකාලයතෙම තිථියෙන් හා නක්ෂත්‍රයෙනුත් විෂමවේ. එහෙයින් සම කරණු පිණිස අධිමාස පතනයවනකල්හි මාසයකුදු දවසකුදු ඇදියයුතුය. එහෙයින් අන්‍යකාලයෙක්හි විෂමවූයේද ආකර්ෂණයකරණකාලයෙහි සමකටයුතුය. මෙසේ ඇතිකල්හි මාස සෘතු සංවත්සරයන්ගේ සමභාවය වේයයිදතයුතුය.

විනයාලඞ්කාරයෙහි දැක්වූ වාද අටෙන් මුල් වාදහතරට විනිශ්චයදී ත්‍රෙබෙත්තේ අධිමාසපතනයවන වර්ෂවලම ඒ අධිකමාස දිනහැර සෘතු වර්ෂ සමකරගන්ටමයි. ශරත්කාලයෙහි චන්ද්‍රබිම්බයක්මෙන් මේ නිගමන පාඨය දැක්වීම විමංසාඥාණාක්ෂිය ඇති යවුන්ට පැහැදිලිව වැටහී පැණේ. එහෙයින් අනධිමාස වර්ෂයන්හි අධිමාස හැරීම විනයානුලෝම නොවන්නේබවද එය සූත්‍ර සූත්‍රානුලෝම දෙකට විරුද්ධවූ අශාසනික ක්‍රියාවක් බවද දතයුතුයි.

(ද්විතීය භාගය.)

---

* කෙවලව වාරාකර්ෂණයකිරීමත් යාචාධිමාසම්තග්‍රාහිකයෝ පිළිගෙණ කිබෙත්, පොතේ දැක්වූ වාද අටෙන් ඒත් එක වාදමතයකි.

ශාසනික ප්‍රතිපත්ති පුරණ භික්ෂූන්ගේ පහසුවිහරණය පිණිස සෘතු සංවත්සර හැඳිනීමට "උතුනිධිපන සාසනෙ හෙමන්ත ගිම්හ වස්සානානං වසෙන තීනිංහානයි" යනුවෙන් සෘතු තුණක් දක්වනලදී. ඒ සෘතුන්ගේ ආරම්භාවසානයන් "කත්තිකස්සචකාලම්හා" යනාදීන්* කාර්තික නක්ෂත්‍ර සංයොග පෞර්ණමියෙන් පසු අව පෑළවිය පටන් යම්තාක් ඵාල්ගුණී නක්ෂත්‍ර සංයොගයවූ පෞර්ණමී දද ඒතාක් හෙමන්තසෘතුවය. එම පෞර්ණමියෙන්පසු අවපෑළවිය පටන් යම්තාක් ආෂාඪ නක්ෂත්‍ර සංයොග පෞර්ණමියද ඒතාක් ග්‍රීෂ්ම සෘතුවය. එම පෞර්ණමියෙන්පසු ලැබෙණ අවපෑළවිය පටන් කාර්තික නක්ෂත්‍ර සංයොග පෞර්ණමිය දක්වා වර්ෂා සෘතුවය. ශාසනික කටයුතුවලට නියමය මෙන්ම වෙදවෙදාඞ්ග ග්‍රන්ථයන්හිද සෘතු නියමයයි. මෙ ක්‍රමය හැර මේෂරාසියපටන් මීනරාසියට වශීගැණ ශාසනික කටයුතු වලට ගන්ට නියමයක් නොමැතිසි.

මෙසේ සෘතු මාස හැඳිනගැන්මට ඒ ඒ මාසවලට—"නක්ෂත්‍ර නාම්නා මාසාස්තු" යනාදීන් නකත් දෙකතුණ එක එක මාසයක් පාසා නියමවා පමණක්නොව වෂමවර්ෂවල සෘතුසලකාගැන්මටද තවත් නකත් ජීවී සංයොග ලක්ෂණවලින් මාසහඳුන්වා දීමෙන් සුබ වර්ෂා සෘතුව දැනගැන්මටද—මනුසංඝ්‍යාවෙහි—

වැදගත් උපදෙශයක්,,

"යත්කිඤ්චින්මධුනාමිශ්‍රං ප්‍රදද්‍යාත්තුත්‍රයොදශිං,
තදප්‍යක්ෂයමෙවස්‍යාත් වර්ෂාසුච මඝාසුච."

"මිධුමිශ්‍රකරණලද යම්කිසිවක් වර්ෂාකාලයෙහි මානකත් ඇති තෙලෙස්වකහි දෙන්නේද- එදවනාහි අක්ෂයවන්නේය- මිට විකාමන්වෙව මුක්තාවලියෙහි "වර්ෂාකාලෙ මඝාත්‍රයොදශ්‍යාඃ"යී- වර්ෂාකාලයෙහි මානකතින් යුත් තෙලෙස්වක්හිය කියාය- "තත්‍රාපි පෞෂ්ඨපදමිතීතායාං මඝායුක්තායාං ත්‍රයොදශිං ප්‍රාප්‍යශ්‍රාද්ධංහි කාර්‍ය්‍යං" එහිදු බිනර පුර පසලොස්වක ඉක්මුණුකල්හි මානකතින්යුත් තෙලෙස්වකට පැමිණි ශ්‍රාඞ විධිය කටයුතුමැයි කියාද- "කෘෂ්ණත්‍රයොදශී පූර්වත්‍රභ වන්‍රයනෙත"යී යනුවෙන් බිනර කළුවර තෙලෙස්වක පරද- මෙහිද ගත්යාලැබෙයි කියනලදී.

---

"කත්තිකස්සච කාලම්හා යාව ඵග්ගුණ පුණ්ණමා
හෙමන්තකාලොති විඤ්ඤෙය්‍යා අච්ඡිහොන්ති උපොසථා"

"ඵග්ගුනස්සච කාලම්හා යාව ආසාළ්හී පුණ්ණමා
ගිම්හාන කාලොති විඤ්ඤෙය්‍යා අච්ඡිහොන්ති උපොසථා"

"ආසාළ්හස්සච කාලම්හා යාවකත්තික පුණ්ණමා
වස්සානකාලොති විඤ්ඤෙය්‍යා අච්ඡිහොන්ති උපොසථා"

එබැවින් වස්සානසෘතුවෙහි පස්වෙනි කලුවරපක්ෂයෙහි තෙලෙස්වකට මාසගත යෙදෙනබවද ඒපක්ෂය පුර පෑළවියෙන් ලබන මාසක්‍රමයෙන් බිනරමස අපරාඪීය බවද දතයුතු, මාස ත්‍රිලක්ෂණයෙන් ගන්නාලෙදී. මෙයින් සැලකියයුතුව තිබෙන්නේ බිනර පුරපසළොස්වක ගිය අව පෑළවිය පටන් වප්මස පුර පසළොස්වක දක්වා වස්සානසෘතුවේ තුන්වෙනි මාසය බවයි— මෙයින් අධිමාස විරහිත සුබ වස්සාන සෘතුව බව සැකහැර ගතයුතුබවට තවත් වැදගත් නොසෙල්වියහැකි සාධක ලක්ෂණයක්නම්— ඛණ්ඩ කලියුග වර්ෂයෙන් මණ්ඩලකොට බෙදගන්නාලද සොළසාධිමාසය ලබන වර්ෂය පැමිණීමට පූර්වනිමිත්තවශයෙන් මේ වර්ෂ [illegible]නාධිමාස වර්ෂබව මෙහි දක්වනලද සුබ වස්සානසෘතු ලක්ෂණයෙන් සැකහැර දතයුතුයි. ශකවර්ෂ (1790) ලිතේ බිනරමස (28) වෙනි සඳුදින අස්ලිසේ පැ. 19 වි. 15-යි— තෙලෙස්වක– පැ. 45 යි– ශකවර්ෂ (1809) ලිතේ බිනරමස (28) වෙනි ගුරුදින– අස්ලිසේ පැ. 19 වි. 5 යි– තෙලෙස්වක– පැ. 45 වි. 50 යි—ශකවර්ෂ (1828) ලිතේ බිනරමස (28) වෙනි රිවිදින අස්ලිසේ පැ. 5 වි. 23 යි— තෙලෙස්වක පැ. 32 වි. 38 යි.

මාසගත තෙලෙස්වක සමග මේ මණ්ඩල තුණකම යෙදී බුරුම මණ්ඩල ක්‍රමයට සොළසාධිමාසය ලබන වර්ෂයට පළමු වර්ෂයේ ලැබෙන බවත් යාවාධි මාසක්‍රමයට මෙම වර්ෂයේ දසාධි මාසයක් තබා වෙන අධිමාසයක්වත් නැතිව සුබ වස්සාන සෘතුවම පැමිණී බවදතයුතු. මෙම මණ්ඩලක්‍රමයටම ගතවූ ශකවර්ෂ (1826) වෙනි වර්ෂයේ පැමුණුනු අධිමාසය තෙරසාධිමාසයබවට "යාං තිථිං සම්නු ප්‍රාප්‍ය තුලාං ගච්ඡති භාෂ්කරඃ" යනාදි ශ්ලෝකදෙකේ ලක්ෂණයට ශකවර්ෂ (1788) ලිතේ තුලාරවිය පටන් මීනරවිය දක්වා (7) කින්ද ශකවර්ෂ (1806) ලිතේ තුලාරවිය පටන් මීනරවියදක්වා (12) වකින්ද. ශකවර්ෂ (1826) ලිතේ තුලාරවියපටන් මීනරවිය දක්වා (8) වකින්ද. මණ්ඩල තුණකින්ම සැකහැර ගතයුතුවේ. මෙම මණ්ඩල ක්‍රමයෙන්ම අෂ්ඨාරසාධිමාසය පතනයවීමට ප්‍රථම වර්ෂයෙහි වස්සානසෘතුව සුබව ලැබීම මේ ශ්ලෝකයෙන් දතමැනවි.

"ශ්‍රාවණෙණමාසිලග්නස්ථා සසිනාසහරෝහිණී
ජයන්තීපූර්ණතාමස්‍යා දශ්ටම්‍යාසංගතොනවා"යි.

මෙහිදක්වනලද රෙහෙණි නකතින්යුත් අටවක යෙදෙන කලුවරපක්ෂය ප්‍රකෘතිවිධියෙන් වස්සානයේ තුන්වෙනි පක්ෂයයි. ශකවර්ෂ (1792) ද (1811) ද සිංහරවිවල බැලියයුතුයි. වර්ෂතුණෙන් තුණෙන් අධිමාස පැමිණෙන වර්ෂවලට මුලින් වර්ෂවල බොහෝ

සෙයින් මිථුනරවියතුල චාන්ද්‍ර ඇසළමස් පැමිණෙනහෙයින් ඒ කොන්මස්යයි වෛදිකයන්ගේ යාගහෝමාදිය නොකොට හැරීමත් ශාසනික ක්‍රියාගැණ ගරුකොටගැන්ම ප්‍රඥාගොචරනොවේ. මෙහි දක්වූ ශ්ලොකවලින් ඒ වර්‍ෂා ඍතු සුඩබව කාරණා සහිතව පැණේ. හෙමන්තාදී ඍතුක්‍රමයෙහිම ලැබෙන අධිමාස ග්‍රීෂ්ම ඍතුවටම රැගෙණ පොහෝ දසයක්කිරීමෙන් වර්‍ෂාඍතුව සම්කොට ගැණීම නියමයමිස මතු ඍතුවල පැණෙන අධිමාසයක් මුලින් ග්‍රීෂ්මඍතුවට අස්ථානයෙහි ඇඳගැන්මට උපදේශ නැතුවාක්මෙන්ම එයින් සමඍතුවද්‍ය විසමවී ඍතු විපය්‍යාසව යනවාපමණක් නොව "නක්‍ෂත්‍රනාමිනා මාසාස්තු" යන උපදේශයට විරුඩව මාස යොදාගැන්මද නොහැකිවෙයි. ඛණ්ඩකලියුගවර්‍ෂයෙන් මණ්ඩල කොටගන්ට නියමකොට තිබ්ම වෙදාඞ්ග ග්‍රන්ථයන්හි ආ මණ්ඩල ක්‍රමය බව. තෙරසාධිමාසය පතනයට ප්‍රථම වර්‍ෂයෙහි තුලාරවිය පටන් සංක්‍රමණවීම එකම තිථියකින් වේයයි දිහිබෙන උපදේශයෙන් පැණේ. සමහර වර්‍ෂවල මෙෂය දක්වාත් ඒ තිථියම වලඳසි. මේ මණ්ඩලක්‍රමය වෙද වෙදාඞ්ග ග්‍රන්ථයන්හි ආක්‍රමයටම විනයාලඩකාරයෙකින් ඛණ්ඩකලියුගවර්‍ෂයෙන් බෙදාගන්ට නියමකොට තිබෙන ක්‍රමය වෙන වර්‍ෂක්‍රමයකින් බෙදාගැණීමෙන් මාස ඍතු පරිවෘත්තනයවීම වනබව දූත් පවත්වන විපරීත සිරිත්වලින්මත් ඔප්පුවෙයි.

ඛණ්ඩකල්‍යාබ්දයෙන් මණ්ඩලකොටගන්නාවුන්ට යාවාධිමාසවශයෙන් හරින වසුසොළස දෙකෝපමණක් මාසඍතු විෂමයවනුමිස ඉතුරු අධිමාස පස විෂම නොවෙයි. එය දූත දූනම ආචිනනකල්පිකව දළඟාහිව විසූක්ඛාඩ්ණයකොට ඍතු පරිවෘත්තන කිරීමෙන් පොහෝ පවුරුණු අක්‍ෂත්‍රයන්හි කඩිණවස්ත්‍රගැණීම් ආදිය කෙරෙත්. ලජ්ජී කුක්කුච්චක ශික්‍ෂාකාමීහු "විනයං පත්වා ගරුකෙ ඨාතබ්බං ගරුකලහුකෙසුචි ගරුකෙයෙව ඨාතබ්බං" යන අවවාද සිත්වලට ගන්නාහු නම් මෙරට ව්‍යවහාර කලියුගවර්‍ෂයෙන් මණ්ඩලකොට බෙදාගෙණ විසූක්ඛාඩ්ණය නොකරත්.

මේ විපරීතය දූත දූනම ආධානගාහිව කරණ හිතුවක්කාක්බව සැළකීමට කරුණුපැණේ.

එනම්. බොම්බායේ ශ්‍රීදුර්ගාප්‍රසාදනම් පණ්ඩිතයෙක් විසින් සාදා ප්‍රසිඩකොට තිබෙන "අධිමාස පරීක්‍ෂා" නම් පොතේ.

"925" "19"
ශාකෙබාණකරාඞකෙෂ් විරහිතෙ නන්දෙන්දුභිඃජිතෙ-

"3" "11" "19" "8"
ශෙෂෙචත්‍රිමධෞච මාධවශිවෙ ජ්‍යෙෂ්ඨෙම්බරෙචාෂ්ටකෙ-
(බක්) (වෙසක්) ( පොසොන් )

"16" "5" "13"
ආෂාඪේ නෘපතෞ නභස්‍යවසරෙ භාද්‍රෙච විශ්වාංශකෙ-
( ඇසල ) ( නිකිණි ) (බිනර)

"2"
නෙත්‍රෙවාස්විනි කෙධිමාසළුවිනඃ ශෙෂෙත්‍යකෝස්‍යානකයි-
( වප් )

යනමේ ආකුල ශ්ලොකයෙන් සමෙකුට උච්චනාවන වර්‍ෂ සක් රැගෙණ බාණකර අඞක යන (925) ක් හැර සිටිශෙෂය "නන්දෙන්දු" යන (19) යෙන් බෙදූ ශෙෂවූයේ (3) නම් බක්මසක් (11)නම් වෙසක් මසක්(19) (8)නම් පොසොන්මසක්(16)නම් ඇසළ මසක් (5) නම් නිකිණි මසක් (13) නම් බිනර මසක්, (2) නම් වප් මසක් අධිකයයි මාසපිළිවෙලක් දක්වාපු ශ්ලොකයේ(8) නම් පොසොන්මසයයි දක්වීමදූක පසුගිය(1826)යේ පැමිණි බණ්ඩකල්‍යාබ්දයෙන් බෙදූ පෙණෙන තෙරසාධිමාසය වැසීමට මෙරට ව්‍යවහාර කලියුගවර්‍ෂයෙන් මණ්ඩලකොට ගත්තාමත් අටසාධිමාසය යෙදීලාය. එය එසේ හරිබවට බොම්බායේ ශ්‍රී දුර්‍ගාප්‍රසාදපණ්ඩිතයාගේ "අධිමාසපරීක්‍ෂා" නම් පොතේ "ශාකෙබාණ" යනාදී ශ්ලොකයෙන් ගැණ බැලුවත් අටක් ශෙෂවේනවායයි ප්‍රකාශකොට ඒවර ලොව මුලාකල නමුත් ඒ(1826)වර්‍ෂයේ අධිකවූයේ ඇසලනොව පොසොන් මාසය බව ලිත්වලබැලූවාම ශ්ලොකයේ නියමයත් යෑවාධිමාසමත ග්‍රාහිකයෝ කෙළේ වඬාවබවත් හොඳකාරපැණේ. එපමණක් නොව ලබන (1829) යේ පෙණෙන අධිකය මෙම ශ්ලොකයේ ක්‍රමයට ගැණ බැලූවාම (11) ක් ශෙෂව වෙසක්මසක් අධිකව පෙණෙන්නමුත් සියලු ලිත්වලම බක්මසක් අධිකවම දක්වයි. එයිනුත් ශ්ලොකය දූෂ්‍යඑකකි. මේ විපරීත දූන දූනම (1826) ට පෙණුනු අධිකය මිථ්‍යාමතයට අටසාධිමාසකොට ඊට ඉහතින් වර්‍ෂයේ යාචාධිමාසයයි කියා අධිකහැර ලබන වර්‍ෂයට හැරියයුතු අධිකය එහිදී හැරියොත් වර්‍ෂසතරක්ව පේණ බැවින් ඊට බලවත් වඬාවක් යොදූ ලබන වර්‍ෂයට නොව මේ වර්‍ෂයට දසාධිමාසවෙනවාය. පවත්වාඑන සිරිතටත් හරිය ශ්ලොකයේ අකුරක් වැරදීලාය එය දහයට

ගත්තාම මෙම වර්ෂයටම අධිකහැරීමම හරියයි. කාරණය මේවරුත් වසා පිරිමසාගත්ටම යත්නකරත්. නමුත් ශ්ලොකයේ දශයකින් අධිකමාසයක් යොදු නැතිබවත් ඊට මාසයක් නියමනැති බවත් විමංසක උදවියට පැණේමැයි. මේබඳු සාහසික වචාකිරීම් දවල් කරණ හපන් සොරකම සමානයි. —මෙය බලත්වා—

| ශකවර්ෂ = | ශෙෂ = | ඉන් නියම මාස = | ලිත්වල = |
|---|---|---|---|
| 1815 = | 16 = | ඇසල = | ඇසල = |
| 1818 = | 19 = | පොසොන් = | පොසොන් = |
| 1821 = | 3 = | බක් = | වප් = |
| 1823 = | 5 = | නිකිණි = | නිකිණි = |
| 1826 = | 8 = | පොසොන් = | පොසොන් = |
| 1829 = | 11 = | වෙසක් = | බක් = (බොම්බායේ ලිතේ) |
| 1831 = | 13 = | බිනර = | නිකිණි = |
| 1834 = | 16 = | ඇසල = | ඇසල = |

සලිදු දඹදිව කාශිරට ශ්‍රීභාගීරථසූනු පණ්ඩිතයාවිසින් ශකවර්ෂ 1828 ක් වන මෙම වර්ෂයට පෞර්ණිමාස්‍යන්තක්‍රමයෙන් ගණිතා ලද ලිතේ ඵාල්ගුණ ශුක්ලපක්ෂය අවසන්කොට ඊලඟ මීනරවියේ යෙදෙන කෘෂ්ණපක්ෂය "ප්‍රථමචෛත්‍ර කෘෂ්ණපක්ෂඃ" කියා සඳහන් කොට තිබේ. කාශීරටම සුධාකර ද්විවේදිපණ්ඩිතයාගේ සූර්ය සිද්ධාන්තානුසාරී පඤ්චාඞ්ගලිතේද. කුම්භරවි 1[illegible] භාග තිබ්දින "චෛත්‍ර කෘෂ්ණපක්ෂඃ" කියා පටන්ගෙණ එහි මාසේපෝය, ගුරුදින අමාවක පැ 12 වි. 21 මීන සඞ්ක්‍රාන්තිය 5. 37. ඊලඟ පෑලවියෙන් පටන්ගෙණ "අධිකචෛත්‍ර ශුක්ලපක්ෂඃ"යි දක්වා—ඊලඟට "අධිකචෛත්‍ර කෘෂ්ණපක්ෂඃ" කියා අතික්පක්ෂය යොදාතිබේ. එය මීනරවි 31 භාගයෙන් අවසානයි. බොම්බායෙහි ධවලපුර පණ්ඩිත භොලරාම ගඞ්ගාරාම දෙදෙනාගේ දශවර්ෂීය භාරතමාර්තණ්ඩ පඤ්චාඞ්ගයෙහි කුම්භරවි 17 භාගයෙන් ලබන අව පෑලවියදිනට පසුදින "ප්‍රථම චෛත්‍ර කෘෂ්ණපක්ෂඃ" යනු යොදා මීනරවි සඞ්ක්‍රමය— 4. 31. අමාවක 12. 17. දක්වා ලබන ශකවර්ෂ 1829 යේ ප්‍රථම චෛත්‍ර ශුක්ල පක්ෂයත්. ද්විතීයචෛත්‍ර කෘෂ්ණපක්ෂයත් "මලමාසඃ" කියාත් යොදා, මීනරවි 28 භාග කුජදින මාසේපෝය ලැබීමත් 29 වෙනි බුදදින රවි මෙෂසඞ්ක්‍රමණයත් දක්වාතිබේ. ඊලඟට ලැබෙණ ද්විතීය ශුක්ලපක්ෂයත් ද්විතීය වෛශාඛ කෘෂ්ණපක්ෂයත් අමාන්ත සුඛ,

ඛක්මාසයවෙයි. කන්‍යාරවි 18 භාගයෙන් කාර්තිකස්නා නාරම්භය හා තුලා 16 භාගයෙන් ඉල් පසළොස්වකද කාර්තිකස්නාන සමාප්තිය දක්වා තිබේ.

කාශීරටම පණ්ඩිතගණේශගේ රාජරාජෙශ්වරී පඤ්චාඞ්ගයෙහිද, ලාහෝර්පුර පණ්ඩිත් දේව්දයාලුගේ පඤ්චාඞ්ග දිවාකරලිතේද, කාශී බනාරස්හි පණ්ඩිතබාලදෙවගේ ලිතේද, ජෝධපුර ශ්‍රීධර ශිවලාලජීගේ චණ්ඩු පඤ්චාඞ්ගලිතේද, එහිම. නීමචනගරයෙහි පණ්ඩිත තුකාරාමජාවජීගේ චණ්ඩුමාර්තණ්ඩ බ්‍රහ්මපක්ෂිය පඤ්චාඞ්ගයෙහිද, බොම්බායේම ජොධපුරයෙහි ලිත්පසකද මෙසේම නියමකොට තිබේ. ඒරටවල සහ මෙරට කොයිවිගේත් ඒකාකාරව චෛත්‍රමාස සටහන්කොට තිබියදී කිසිවක් නොසලකා සැතුමාස නොහැඳින කරණ විහිලුත් දෛවත විකාරත් පුදුමමයි.

පසුගිය කටකරවි 20 ශනිදිනවූ චන්ද්‍රග්‍රහණයත් සියලු ලිත්වලම ඒකාකාර දක්වූවන්ට මේ අධිමාසය හැරියයුතු සැතුව නියම කරන්ට නොතේරුණායයි කවරෙක් සිතාද! ලබන වර්ෂයට හැරියයුතු අධිමාසය මෙම වර්ෂයේ හැරීමට උපදෙස්ගත් පොත හෝ ලිත සියල්ල නට්ටබලා තේරුම්ගන්ට වහා ප්‍රකාශකලහොත් මැනවි. සියම් බුරුමාදි බුද්ධසාමයිකයෝද මේ ලිත් පිළිවෙලටම රැගෙණ තිබීම ධර්මශාස්ත්‍ර යුක්ති සොයා පිළිපදින්නාවුන්ට සතුටුදායකවෙයි. අහෝ. ශාසනික සීලසුද්ධියට දක්වාතිබෙන පිළිවෙලවල් කඩාබිඳ හැර හිතුවක්කිරීමෙන් ලොකයාත් මුළාකරන්ටම උත්සාහ වඩත්, බුරුමරට සියලුතැන ව්‍යවහාරකරණ ඛණ්ඩකල්‍යාබ්දයෙන් මණ්ඩලකොට බෙදාගතයුතු අධිමාස පිළිවෙල මෙරට ව්‍යවහාරකරණ ගතකල්‍යාබ්දයෙන් මණ්ඩලකොට බෙදාගෙණ කරණ විහිලුව ශකවර්ෂයෙන් බෙදා බලන අධිමාස පතනයෙන් ලැබෙණමාස දැනගන්ට කරතිබෙන නියමයෙන් විසන්ට යන්නකිරීම භයානක සාහසික කරුණක් නොවෙන්ටඇති හේතුකිම! ශකවර්ෂය බුරුමරට එකක්‍රමයකි, සියම්රට එනක්‍රමයකි, බොම්බායෙහිත් මෙරටත් එක ක්‍රමයකි, සියම් බුරුම දෙරටෙහි ව්‍යවහාර ශකවර්ෂවලින් ගැණගත්තොත් මොන මොන මාසවලට අධිමාසලැබේද, ශ්ලොකයේ දක්වාපු මාස ලැබේද, අසවල් ශකවර්ෂයයි නියමයක් නොකොට තිබෙනාහෙයින් වික්‍රමාදිත්‍ය ශකවර්ෂයෙන් ගැණ බෙදාගත්තොත් කෙසේ අධිමාසදැන ගතහැකිද; බොම්බායේ පොතේපෙණෙන ශකවර්ෂයෙන්බෙදා අධිමාස දැනගන්නාක්මෙන් විද්‍යාලඞ්කාරයෙහි පෙණෙන ඛණ්ඩකල්‍යාබ්දයෙන් මණ්ඩලකොට නොගෙණනොදැනකල වැරැද්ද දැන දැනම

හරිගස්සන්ටැත්ත කරන්නෙත් කලඑකම කරන්නෙත් ශාසනා ලයකින්යයි කවරෙක් සලකත්ද;

ඇත්තසලකණ සාධාරණ කල්පනාඇතියවුන්ට මේ වනාව පෙණේයයි වැටහෙනවා නම් බුරුමරට ව්‍යවහාරකරණ වර්ෂයෙන්ම ගැන බෙදූ අධිමාස දැනගන්නවාඇති, වර්ෂ හතඅටකට වැඩිකාලු සත් නොයෙක් කාරණා දක්වමින් සිටියදී ඒ නොසලකා කරණ ක්‍රියා මෙලොවසිටිනතුරු ජීතුවක්කිරීමේ අභිලාසීයත් පරලොව තෘණලවයක්පමණ නොසැලකීමත් යනදෙක උඩපිහිටායයි සලකන්ට ඉඩපෙණේ. එහෙයින් උභයලොකාර්ථකාමී සැදැහැතියන්ම මෙහෙමදේ පැමිණිවිට සුද්ධලප්‍රමාණත් සැලකීම යුතුව තිබෙයි. ලක්ෂගණන් සඞ්ඝයා වැඩසිටින සියම් බුරුම දෙරටෙහිත් ශාස්ත්‍රාගමධාරී පණ්ඩිත සර්වරාදීහු ඇසීවීම අනුමිගනෙනාවේ. ඒ දෙරටේ සඞ්ඝයා මෙම වර්ෂයේ අධිකනැර වස්විසීමත් සියලුරටවල ව්‍යවහාර කරණ ලිත්වලත් මෙම වර්ෂයට අධිමාස සටහන්කොට නොතිබීමත් ගරුකොට සැලකියයුතු වැදගත් කාරණායි.

එසින්ම මෙම වර්ෂයේ අධිමාස හැර වස්විසීම ශාස්ත්‍රානම දේකට ඉඳුරාම ප්‍රතිපක්ෂ අවිනය ක්‍රියාවක්බව විශෙෂයෙන්ම සැලකීමෙන් මිථ්‍යාමතයෙහි නොබැඳී ආත්මාර්ථ සිඬිය පිණිස උත්සාහ වඩන්වායි ආශිංසනය කරමහ.

1 බොම්බායාඛ්‍යපසිඬඉඬවිජ්ජනෙ “දුග්ගප්‍රසාදෙන”හි
උප්පනනාධිකමාසවාද සමනාථා යෙව ගහෙත්වකතො,
“ශාකෙබාණකරාඬ්කෙකෙර්”ති පිලොකෙදීපිතානීබල
ඨානානි පරිග්‍රහාදිපයතිතං සාවාධිමාසකකාමං;

2 බොම්බායවාසී ගණීතඤ්ඤුවාපී
එතං සිලොකං නගරං කරොනති,
තථාපියාවාධිමතාවලම්බා
පගගයහසස්ථංච කරොනතිවාදෙ;

3 එවං විපනනමතයො යතයො ඉමස්මිං
වස්සායකෙ අනධිමාසකභායනමහි,
උක්කඩ්ඪෙරො ව අවසිංසු විසුඬමාසං
ශකාතෙ සමෙති මහිජො විබුධොපසත්ථෝ;

තෘතීය භාගය.

| | වී | පඹ | අඩ | දස | තෙරස | සොළස | අඩාරස |
|---|---|---|---|---|---|---|---|
| ඛණ්ඩකල්පාබ්දම්* | 1160 | 1163 | 1166 | 1168† | 1171 | 1174 | 1176 |
| ශකාබ්දම් | 1720 | 1723 | 1726 | 1728† | 1731 | 1734 | 1736 |
| ඛණ්ඩකල්පාබ්දම්. | 1179 | 1182 | 1185 | 1187 | 1190 | 1193 | 1195 |
| ශකාබ්දම් | 1739 | 1742 | 1745 | 1747 | 1750 | 1753 | 1755 |
| ඛණ්ඩකල්පාබ්දම්. | 1198 | 1201 | 1204 | 1206 | 1209 | 1212 | 1214 |
| ශකාබ්දම් | 1758 | 1761 | 1764 | 1766 | 1769 | 1772 | 1774 |
| ඛණ්ඩකල්පාබ්දම්. | 1217 | 1220 | 1223 | 1225 | 1228 | 1231 | 1233 |
| ශකාබ්දම් | 1777 | 1780 | 1783 | 1785 | 1788 | 1791 | 1793 |
| ඛණ්ඩකල්පාබ්දම්. | 1236 | 1239 | 1242 | 1244 | 1247 | 1250 | 1252 |
| ශකාබ්දම් | 1796 | 1799 | 1802 | 1804 | 1807 | 1810 | 1812 |
| ඛණ්ඩකල්පාබ්දම්. | 1255 | 1258 | 1261 | 1263 | 1266 | 1269 | 1271 |
| ශකාබ්දම් | 1815 | 1818 | 1821 | 1823 | 1826 | 1829 | 1831 |
| ඛණ්ඩකල්පාබ්දම්. | 1274 | 1277 | 1280 | 1282 | 1285 | 1288 | 1290 |
| ශකාබ්දම් | 1834 | 1837 | 1840 | 1842 | 1845 | 1848 | 1850 |
| ඛණ්ඩකල්පාබ්දම් | 1293 | 1296 | 1299 | 1301 | 1304 | 1307 | 1309 |
| ශකාබ්දම් | 1853 | 1856 | 1859 | 1861 | 1864 | 1867 | 1869 |
| ඛණ්ඩකල්පාබ්දම් | 1312 | 1315 | 1318 | 1320 | 1323 | 1326 | 1328 |
| ශකාබ්දම් | 1872 | 1875 | 1878 | 1880 | 1883 | 1886 | 1888 |
| ඛණ්ඩකල්පාබ්දම් | 1331 | 1334 | 1337 | 1339 | 1342 | 1345 | 1347 |
| ශකාබ්දම් | 1891 | 1894 | 1897 | 1899 | 1902 | 1905 | 1907 |
| ඛණ්ඩකල්පාබ්දම් | 1350 | 1353 | 1356 | 1358 | 1361 | 1364 | 1366 |
| ශකාබ්දම් | 1910 | 1913 | 1916 | 1918 | 1921 | 1924 | 1926 |
| ඛණ්ඩකල්පාබ්දම් | 1369 | 1372 | 1375 | 1377 | 1380 | 1383 | 1385 |
| ශකාබ්දම් | 1929 | 1932 | 1935 | 1937 | 1940 | 1943 | 1945 |
| ඛණ්ඩකල්පාබ්දම් | 1388 | 1391 | 1394 | 1396 | 1399 | 1402 | 1404 |
| ශකාබ්දම් | 1948 | 1951 | 1954 | 1956 | 1959 | 1962 | 1964 |
| ඛණ්ඩකල්පාබ්දම් | 1407 | 1410 | 1413 | 1415 | 1418 | 1421 | 1423 |
| ශකාබ්දම් | 1967 | 1970 | 1973 | 1975 | 1978 | 1981 | 1983 |

* නික්ඛන්තං නාතියෙ හුත්වා ගොතිශො දුතියෙ සකිං,
නාතියෙ පුන නික්ඛන්තං නාගොව දුතියෙ සදෙව.

†† මෙම වර්ෂයෙහි කොස්ගොඩ (බෝගහපිටියේ) ධම්මජොති මහාස්ථවිරපාදයන් වහන්සේට ඤාණාභිවංස ධම්මසෙනාපති සංඝරාජ්ජගුරුවෝ වෛදවිනිශ්චයාවශාකයෙහි අධිමාස මණ්ඩල ලියා දශාධිමාස දිනයෙහි එම පොත දුන්බව සටහන්කොටතිබේ, ලක්දිව් වැසි අමරපුරවංශික සියලු සංඝයාවහන්සේලාට අවුරුදු පිකාකාලවලින්පසු ගරුකටයුතු කෙනෙක් ඊනැර නැතුවාමිද. ඒ දූතාදූත පිහුව ක්තරගත් ලොකශාසනදෙක නොසලකායයි කල්පනාකටයුතුවේ මුලුලෝක යේම එකක්ව පවත්වන සිරිතට විරුඩව කරණ ක්‍රියා සිතුවක් කිරීමටම ලැදි ඔවුන්ගේ සිරිතකි.

මෙරට් ව්‍යවහාර කලියුගවර්ෂයෙන් "ගතකලියුගතොනවතී සතතතීනිපහීනෙන" යනුවෙන්(3739) හැරශෙෂව ගණිත බුරුම් රට ව්‍යවහාරකරණ ඛණ්ඩකල්‍යාබ්දයෙන් 1009 දී විනයාලඞ්කාරය කලවච පොත අවසානයෙහි දක්වා තිබේ. ඤාණාභිවංස ධම්මසෙනාපති සංඝරාජකාලයෙහි සිරි රජතුමාගේ එම වර්ෂයෙන් 1144 ලේදී රාජ්‍යශ්‍රීපදප්‍රාප්තියද, ඒවර්ෂයේ සිට 25 වෙනි වර්ෂයෙහි වෙදවිනිශ්චය කොට පාළිභාෂාවට නගවා, බෝගහපිටියේ ධම්මජොති මහාස්ථවිරපාදයන්වහන්සේට දුන්දින දශාධිමාස සුබදිනයෙහියසිද දක්වා තිබේ. ඒ ගණ්නෙතින් ඛණ්ඩකල්‍යාබ්දග 1168 වේ දශාධිමාසයයි. කල්‍යාණිප්‍රකරණයෙහි දක්වා තිබෙන විරාෂාඨය මෙරට ව්‍යවහාර ශකවර්ෂයෙන් 1400 ලේයි. ඛණ්ඩකල්‍යාබ්දයේ පෙණෙන 1168 ට 328 ක් වැඩි 1728ක් වන ශකවර්ෂයව පෙණේ. ඒ කල්‍යාණිප්‍රකරණයේ ජේෂ්ඨ අධිමාසය ඛණ්ඩකල්‍යාබ්දගණිතින් 66 වෙනි මණ්ඩලයේ පඨාධිමාසයයි. ඒ ගණිතින් සංඝරාජ ලියමනේ ජේෂ්ඨ දශාධිමාසයට එකතුවියයි වෙදාඞ්ගග්‍රන්ථයන්හි දක්වා තිබෙන මණ්ඩලක්‍රමයම ත්‍රිපිටකාලඞ්කාරස්ථවිරයන්වහන්සේද ඤාණාභිවංස සංඝරාජ සාමිපාදයෝද රැගෙණ ඛණ්ඩකල්‍යාබ්දයෙන් මණ්ඩලකොට ගන්ට පොදුතිබෙනාවච වෙදාඞ්ගග්‍රන්ථයන්හි අධිමාස ලක්ෂණ නියමකොට තිබෙන ශ්ලොක ටීකාපාඨවලින් පැහැදිලිව පැණේ. මේ සංඝරාජතුමා ලක්දිවැ බුරුම ශාසනවංශය පිහිටවූ ආදී පුරුෂොත්තමයායි. උන්වහන්සේ වෙද විනිශ්චය නානා දෙශික නානා ජාතිකයන් විසින් පාෂාන ඡත්‍රයක්මෙන් ගරුකොට සලකාගන්ට පොත අවශානයෙහි ලියාතිබෙනු දැක දැක මුල්ස්වාමියාවච දැන දැනත් ඊට පිටිපා ශාත්‍රාගම දෙකට ප්‍රතිපක්ෂ හිතුවක්කිරීම ආචාර්ය වංශහානියට හෙතුවෙයි. එහෙයින් ශාසනවංශයෙහි හා වෙද විනිශ්චයෙහි දක්වා තිබෙන ක්‍රමයෙන් අධිමාස සලකාගැන්මට දෙවනුත් වාසගම්දෙකක් මෙහි ඇතුලත්කෙලෙමි.

එනම්-"කලියුගෙ චතුචත්තාළීසාධිකෙ වස්සසතෙ සහස්සෙ ච සම්පත්තෙ මාඝමාසස්ස කාළපක්ඛවාදසමියං අඞ්ගාරවාරෙ උත්තර ඵග්ගුණි නක්ඛත්තෙන යොගෙ අමරපුරංනාම මහාරාජට්ඨානි නගරං මාපෙසි සිරිපවර විජයානන්ත යසත්‍රිභවනාදිත්‍යාධිපති පණ්ඩිත මහාධම්මරාජාති නාමලංඡම්පි පටිගණ්හි"—

"කලියුගවර්ෂයෙහි සිව්සාළිසක් අධිකකොට ඇති වර්ෂ සියයක් හා දහසට පැමිණි කල්හි උඳුවප්මසගේ කෘෂ්ණපක්ෂයෙහි දොළොස්වක යෙදියලන් අඟහරුදින උතුරුපල්ගුණ නකත යෙදීමෙහි

අමරපුර මහාරාජධානිනම් නුවර මැවූයේය. සිරිපවර විජයානන්ත යසතිභවනාධිපති පණ්ඩිතමහාධම්මරාජ යන නාමලංඡනද පිළිගත්තේය"යි ශාසනවංශයෙහි දක්වා තිබේ. "ජද්දන්තගජරාජසාමි මහාධම්මරාජස්ස ජයවස්සතො පඤ්චවීසතිමෙ වස්සෙ ද්වත්තිංසති අට්ඨසත දසාධිමාස සුඛදිනෙ සාවණ්ණමාස කාලපක්ඛසත්තමියං සීහලදීපතො ආගතස්ස පනසඵල මණ්ඩලසඞ්ඛ්‍යස්ස බොධිතරු පිට්ඨිනාමස්ස ධම්මජොතිස්ස ඤාණාභිවංස ධම්මසෙනාපති ථෙරෙන නීය්‍යාදිතා මහාධම්මරාජ වෙදවිනිච්ඡයකථා පරිනිට්ඨිතා"—

යනුවෙන් "ජද්දන්තගජරාජසාමී මහාධර්මරජුගේ රාජ්‍යාභිෂෙකයෙන් පස්විසිවන වර්ෂයෙහි අටසිය දෙතිස්වන දශාධිමාස සුඛදිනයවූ නිකිණිමසගේ කෘෂ්ණපක්ෂ සතවක්දින සිංහල දිවයිනෙන් පැමිණියාවූ ග්‍රාමසමූහවූ කොස්ගොඩ බෝගහපිටියේනම්වූ ධම්මජොතිභික්ෂුවට ඤාණාභිවංස ධම්මසෙනාපති ස්ථවිරයන්විසින් නිමවාභාරදෙනලද මහාධර්මරජුගේ වෙදවිනිශ්චයකථාවයයි" දක්වා තිබෙනසෙයින් විනයාලඞ්කාරයෙහි දක්වාතිබෙන මණ්ඩලක්‍රමය බව නිසැකවම ඔප්පුවෙයි.

ආචාර්‍ය්‍යපරම්පරාවේ ආක්‍රමය හැර පසුකාලවල මුලාවලින් වරදවා ආක්‍රමම ස්ථිරකරන්ට යාම ශාසනාලය විරහිත ශික්ෂාකාමීනොවන්නාවුන්ගේම ස්වභාවයක්බව දතයුතු.

**නිගමන ගාථා.**

---

1. සම්බුද්ධසාමිසිකස්සාම මරම්මිකෙසු
රට්ඨෙසුචිසු පවිගතානි සුපුරෙසු,
සික්ඛාසුගාරවයුතෙසු සුසංයමීසු
සබ්බවත්ථකම්මිකාවිළුපෙනතිවස්සං,

2. අස්මිංච පත්තාසරදෙ යතයොළුභොතො
ආපුච්ඡනාවිරහිතා පිච අඤ්ඤමඤ්ඤං,
සඞ්ඝාගමෙසු විධිමෙව විචිනතයනතා
වස්සූපගා අනධිමාස නයෙනසබ්බෙ.

3. ලඞ්කාය පණ්ඩිත විභාවි සුසංයමීනං
අත්ථානුපෙපීරමනො අගනෙත්වෙසචි;
චිත්තානුකූල මතමෙව විගය්හවස්සං
උක්කණ්ඨිතා අවසිංසු ඉම මහිවසෙස.

4 ඒකාස ආගතනයෙනච තෙරසාධි-
මාසසස පුබබසරදෙව දිවාකරසස,
එකාය එව තිථියා ජතුලාදිකෙසු
සඞකනතියො අසධිමාස විසෙසනහොනති.

5 සතතාධිමාස විධිතොපනසොළසාධි-
මාසසසආගමනතොත්රපුබබවෙසස,
වසසානුකෙතතියපොටඨ පදම්හි කාල-
පකඛමිසා සහිත තෙරසියෙව හොති.

6 අසමිමපි පනත සරදෙපිච ඊදිසමහි
වසසානකෙ අනධිමාස උතුමහිමාසං,
උකකඩඪිතව අධිමාස නයෙනනෙතච
වසසූපගාව අවිමංසිකජාතිකානතා.

7 අටඨාරසසස අධිමාසකච සසපුබබ-
වසසමහිරොහිණී ච අටඨමීසාවණමහි,
ඝුජජනතියෙ ච අවිරාධිය කාලපකෙඛ
එතං විසුඩ උතුනොපනලකඛණානති.

8 ගනථනතරෙසු අධිමාස පකාසකානි
පොරාණකෙහිරචිතානි විසෙසකානි,
ඨානානිකිඤචි අවිමංසිය ලෙසමතතං
උගගයහවාද මිතමෙව පනයහමාහා.

9 අමෙහවප ණඩිතතරා ඉතිඋණණලාතො
වාදානුවාදකරණෙ අභිලාසවිනතා,
උගෙඝ සයනති මුඛසජිජිතහදයනතා
කිංදීපයනතිඅලිකං පනුදිනසචචං.

10 තෙසං විරුඩමතගාහික සංයමීනං
අඤඤායහෙතකවිධගනථ මතෙසුසාරං,
සංගයහමණඩලනයං වියසාධුකූලං
සඤසසසිං කවිවරා පරිතොසයනතු.

11 සාකෙතසහසසඬ සතම්ඝිඅඬ-
වීසඹිහිවිසෙස අධිමාසකාරං
විත්ථාරයිත්වා ඉහමණ්ඩලානි
සංකාසයිං සංයමිනං හිතාථං.

12 දෙවොපවස්සතු සදූ සුඛෙදපජාතං
භූපාලකාචනිබ්ලා පිහයනතුධම්මං,
සබෙබහවනතුමනුජා සුඛිතා අවෙරා
එසනතුසංයමිගණා පටිපඣතිමගගං.

13 අධිමාසදීපනිංචාපි තථාධිමාස සඞගහං,
යොඅකා අධිමාසානං මණ්ඩලානිපි සො අකා.

මතුඨි භාණසං

---

සමාප්තම්.

# අතිරේකයක්.

—o—

භාෂාශාස්ත්‍ර කීපයක්ම බොහෝදුරට දත උගත් වෛද්‍ය ග්‍රන්ථයන්හි මහා පටුනක් ඇති ගණිඅදයෙක්වන 1906 ට ලිතක් ගැණ ප්‍රසිද්ධකළ ඩබ්ලිව්. ඩී. තෝමස්අප්පුහාමිටද ආචාර්‍ය්‍යභාවූපග ඒ.ඩී.ඒ. විජයසිංහ ආරච්චිමහත්මයාවිසින් බොහෝ පොත්පත් බලා මෙම වර්‍ෂයෙහි අධිමාස හැරීම යුතු නැතිසේ ලියාඑවනලද ලියුමක්ද මීට ඉතා වැදගත් වනහෙයින් මෙහි ඇතුලත්කෙලෙමු.

"මාදම්පේ සිරිවර්‍ධනාරාමාධිපති ආචාර්‍ය්‍ය ධම්මතිලකාභිධාන මහාස්ථවිර පාදයන්වහන්සේවෙත ඔප්පුවන පිණිසයි.—

අභිවාදනයකිරීමෙන් ලියාසැලකරමි. ස්වාමීන්වහන්සේ විසින් එවනලද 23 වෙනි දින දෑතම දරණ ලිවුමත් අද ලදිමි, කරන්ටඟිතු එකම කරන්ට ඕනෑනිසා කියනවාමිස මේ අවුරුද්දේ අධිකයක් නැතිබව ඇත්තකි. මේ අවුරුද්දේ සමහර ලිත්කාරයෝ අධිමාසය මීකරව්යට ඇතුල්කර බක්මාසයක් අධිකයයි එකම කාරණයක් සලකාකීවා වරදයයිහැගේ. නොයෙක් කාරණා සලකානකල ලබන මේෂරවියේදී වෙසක්මාසයක් අධික හැරියයුතු බැව්පෙනේ. ශ: ව: 1823 න් සිටි වර්‍ෂයෙහි යෙදී තිබුනු ශ්‍රාවණාධිමාසය මේවගේම පැයගණනක වෙනසක් නිසා උතුරු දඹදිව සමහර ජ්‍යොතිඥයෝ ඇසලමාසයයි විවාදයක් ඉපදී ඒගැණ උගත් කෙනෙක් නොයෙක් කාරණාපෙන්වා ලියනලද විනිශ්චයේදී "ශාකෙබාණ කරාඞ්කකෙ" යනාදීකීමත් සලකා නිකිනිමාසයම අධිකබැව් තීන්දුකරතිබේ. ලබනඅවුරුද්දෙත් ඒ ශ්ලෝක කියමනත් හැරියටත් සමවන වෙසක්මාසයක්ම අධිකයි. අධික ගණිතක්‍රමයෙන් බැළුවත් ඒ එසේමයි, අවුරුදු 1500 යකට පමණ අධික ගැණුම්ලග දත්තිබෙන හින්දු පොතෙත් ලබන 1829 න් සිටි අවුරුද්දේ වෙසක්මාසයක් අධිකබැව් ගැණ ලියාතිබේ. ඉන්දියාවේ තවත් පංචාංගයත් එසේමයි. පසුගිය පනස් අවුරුද්දේම අච්චුගහපු ලිත් මාලහතිබේ, ඒ ඇර ඉන් ඉහත අවුරුදු විසිගණනකද ලියාපු ලිත් පිළිවෙලටම තිබේ. එයින් දැනගන්ට තිබෙන්නේ මේ ප්‍රකෘති කලියුගයෙන් මණ්ඩලකලාම හැම මණ්ඩලවලම හතරපලක් වරදිනබවත් තුන්පලක් හරියටඇවිත්තියනබවත්ය. වරදින්නේ– 8 වෙනි 10 වෙනි. 16 වෙනි. 18 වෙනි. හතරයි– හරියට තියෙන්නේ 2. 5. 13. වෙනි තුන පමනයි. හතරක් වැරදිලා තුනක් හරිකුමයක්

ගතයුතුවෙන්ටබෑ, මේවා කොහොමවෙතත් හිතුඑකම් කරන්ට සය ඇත්තන්ට මේවා ඕනෑනැතුවා වෙන්ටඇති. (මින් පහත මීට උවමනානොවන වාසගම් හැරියෙමු).

මේවගට, ඉනාකීකරුවූ.

ඒ. සී. ඒ. විජයසිංහ ආරච්චි.

(අත්සන ඉංග්‍රීසියෙන්).

1906 ජූනි 25 දින කළුතර
රෙජිස්ට්‍රාර්කන්තෝරුව ඉදිරිපිට. ලෙසිදිය."

---

(ලක්මිණිපහනෙන් ගන්නාලදී). "බුරුම ගැසට් පත්‍රයේ වර්ෂ 1906 ක්වූ ජූලිමස 5 වෙනි දිනට පැමිණි ඇසළමස අවපෑලවියලුත් දවසේ පෙරවස්එළඹීම හා අගෝස්තුමස 4 වෙනි දිනට පැමිණි නිකිණිමස අවපෑලවියලුත් දවසේ පසුවස් එළඹියයුතු බවද ආණ්ඩුවවිසින් ගැසට්පත්‍රයෙන් ප්‍රසිද්ධකරණු ලැබූයේය" යනුයි.

1906 ක්වූ මෙම වර්ෂයෙහි අගෝස්තුමස 4 වෙන ශනිදින නිකුත්කරණලද ලක්මිණිපහන් පත්‍රයෙන් ගන්නාලදී.

"සියමෙන් කීර්තිශ්‍රී රාජසිංහමහාරාජකාලයේ උපාලිස්ථවිරනාමාදී සඞ්ඝයා ලංකාවට වැඩ උපසම්පදාව පැවැත්වූ කාලයේ පටන් මේ දක්වා පුෂ්පාරාම විහාරයේ ඒ උපාලිස්ථවිරාදීන්ට අනුව බුද්ධවර්ෂය කියනුලැබේ. මේ වර්ෂයේ ජූනිමස 7 වෙනිවූ ගුරුදිනය කියයලද්දේ මෙසේයි.

"ඉමස්ස සිරිසක්‍යමුනි සම්මාසම්බුද්ධස්ස බලවපච්චූස සමයෙ කුසිනාරායං යමකසාලානමන්තරෙ අට්ඨමීසප්පසංවච්ඡරෙ ගිම්හාන උතුම්හි වෙසාඛමාසෙ සුක්කපක්ඛ පණ්ණරසීතිථියං ගුම්මවාරෙ රාධනක්ඛත්තෙ අනුපාදිසෙසාය ඛන්ධපරිනිබ්බාණ ධාතුයා පරිනිබ්බාණදසසංතො පඨම එකමාස එකූන පඤ්ඤාසති සංවච්ඡර චත්තාරීසතාධිකානි වෙ සංවච්ඡර සහස්සානි අතික්කන්තානි අනෙසුං— ඉමස්මිං අස්සසංවච්ඡරෙ ගිම්හාන උතුම්හි ජෙට්ඨමාසෙ කාලපක්ඛ පාටිපද තිථියං ගුරුවාරෙ සම්පත්තා"—

මෙහි 1906 ජූනිමස 7 වෙනි දිනට බුදුන් පිරිනිවීමෙන් ගතවූයේ 2449 ක්හා එකමාසයක් බවද - මේ අශ්වසංවත්සරයෙහි ගිම්හාන ඍතුවෙහි පොසොන්මස කෘෂ්ණපක්ෂයෙහි පෑලවියෙහි ගුරුවාරය සම්ප්‍රාප්තයයි කීයලදී".

## අධිමාස දීපනියෙහි

### අවශිෂ්ට ශුද්ධිපත්‍රය.

---

(විඥාපනයෙහි)

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| | 11 | පසුවසට | පසුවසට |
| | 20 | මිරඥ | මිරඥ |
| | 26 | ශිකෂාපද | ශික්ෂාපද |
| | 27 | චාසි | වාසි |

ගාථාවල

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 3 | 12 | ලබිනං | ලබ්භං |
| ,, | 22 | භික්ඛුනං | භික්ඛූනං |
| 5 | 9 | විසෙසතො | විසෙසතො |
| 6 | 10 | කලාගී | කල්‍යාගි |
| ,, | 17 | භික්ඛුණි | භික්ඛුණි |
| 7 | 10 | ටීකාසුව | ටීකාසූච |
| ,, | ,, | නවඤ්ජිත් | නවඤ්ජිති |
| 8 | 18 | වූධ | වුඩ්ඪ |
| 10 | 2 | මාසමහි | මාසම්හා |
| ,, | ,, | දසාධිමාස නොඅපි | සුද්ධදසා ධිමාසතො |
| 12 | 4 | වීසතෙ | විසතෙ |

භාවසන්නයෙහි,

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 1 | ආශ්‍රිත | ආශ්‍රිත |
| ,, | 5 | උපොසථ | උපොශථ |
| ,, | 16 | මෘගසූකර | මෘගසූකර |
| ,, | 20 | නැඟිට | නැගිට |
| 2 | 4 | සෘතුංවහි | සෘතුවෙහි |
| ,, | 23 | වතස්සාති | වතස්සාන් |
| ,, | ,, | භීකඛු | භික්ඛු |
| ,, | 25 | භික්ඛුනං | භික්ඛූනං |
| ,, | 32 | දූතයක්හු | දූත යක්හු |

ප්‍රථම භාගයෙහි.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 6 | 27 | විවාද | විවාද |
| 10 | 37 | විතීය | විතීය |

විතීය භාගයෙහි.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 11 | 32 | ඤාණාභිවංශ | ඤාණාභිවංසා |
| 14 | 23 | බුඩ | බුඩ |
| ,, | 19 | බ්‍රැම | බ්‍රැම |
| 15 | 9 | තෂමා | තසමා |
| 16 | 28 | හැරහුන් නිශ්‍රිත | හැරහුම් නිශ්‍රිත |
| 17 | 29 | විනයා | විනයා |

තෘතීය භාගයෙහි.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 18 | 26 | මිට | මීට |
| ,, | 29 | ධූසිකාල | ධූසිකාලඃ |

චතුර්ථ භාගයෙහි.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 20 | 9 | ඒශ්ම | එශ්ම |
| ,, | 27 | කියා | කියා |
| 21 | 10 | පූර්ණ | පූර්ණ |

පස්වන භාගයෙහි.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 23 | 8 | අවිරුද්ද | අවිරුද්ද |
| ,, | 40 | සව්ඥෙයා | සර්වඥයා |
| 24 | 21 | නැහැ | නැහැ |
| 26 | 21 | අවිරුද් ද් | අවිරුද්දේ |

| පිට | පෙළ | අශුද්ධි | ශුද්ධි |
|---|---|---|---|
| 27 | 7 | බැලිම | බැලීම |
| ,, | ,, | අවුරුද්දේ | අවුරුද්දේ |
| | 8 | කලියුග | කලියුග |
| | 30 | බුස්කාල | බූස්කාල |
| | 4 | විතීස | විතීය |
| | 5 | සතෙහිම | සතරෙහිම |
| 31 | 18 | ජුණහ | ජූණහ |
| ,, | 29 | විනයා | විනයා |
| ,, | 35 | අවුරුදු | අවුරුදු |
| 32 | 8 | කීයන | කියන |
| 33 | 18 | අභිෂේක | අභිෂේක |
| ,, | 30 | නග | නාග |
| ,, | ,, | ශක | සක |
| ,, | 32 | දුතාව | දූතාව |
| ,, | 35 | ලීන | ලිත |
| 34 | 1 | අෂ්ඨමීයං | අටඨමියං |

සවන භාගයයි.

| පිට | පෙළ | අශුද්ධි | ශුද්ධි |
|---|---|---|---|
| 35 | 11 | ජ්‍යොතිශ් ශාසත්‍ර | ජ්‍යොතිශ් ශාස්ත්‍ර |
| ,, | 21 | ශශි | ශශි |
| ,, | 22 | රිව්‍යනෙන | රිව්‍යනෙන |
| ,, | 23 | සමාවයෙ | සමාවයෙ |
| ,, | ,, | තිරිව්‍යශත | තිරිව්‍යනෙ |
| ,, | 33 | දිකො | ධිකො |
| 36 | 2 | ලිවෙත්පෘ තක් | ලිබෙත්පෘ එක් |
| 36 | 9 | පතතෙ‍්‍යං | පතතෙ‍්‍ය |
| ,, | 21 | ජ්‍යොතිෂෙ | ජ්‍යොතිෂෙ |
| 39 | 26 | අවුරුද්දේ | අවුරුද්දේ |
| 41 | 32 | විද්‍යමාන | විද්‍යමාන |
| ,, | 34 | වී | වි |
| 42 | 31 | දැෂටවා | දැෂ්ටවා |
| 43 | 1 | ශශීයාති | ශශියෂ්ටී |
| ,, | 6 | වීරා | විරා |
| ,, | 16 | වීරා | විරා |
| 44 | 4 | අධී | අධි |

හත්වෙනි භාගයයි.

| පිට | පෙළ | අශුද්ධි | ශුද්ධි |
|---|---|---|---|
| ,, | 33 | මිව | මිට |
| 47 | 17 | අභිනව | අභිනව |
| ,, | 35 | එකගව | එකඟව |
| 48 | 5 | තිපීනං | තිපීතං |
| ,, | 31 | භියමුන් | භික්ෂූන් |

අටවෙනි භාගයයි.

| පිට | පෙළ | අශුද්ධි | ශුද්ධි |
|---|---|---|---|
| 51 | 16 | නොගනිව් | නොගනිව් |

## අධිමාස සඞ්ග්‍රහයේ

### අවශිෂ්ට ශුද්ධිපත්‍රය.

| පිට | පෙළ | අශුද්ධි | ශුද්ධි |
|---|---|---|---|
| | | (විඥාපනයෙහි) | |
| | 9 | වසින් | විසින් |
| 2 | 14 | කොපම ණෙක් | කෙපම ණෙක් |
| ,, | 29 | සැවත්නුව රසමීපයේ දෙව්රම වෙහෙර | රජගහනුව රවෙළුවනා රාමයෙහි* |

* රජගහනුවරදී අධිමාසහරින්ට වදුරා සැවැත්නුවරම වැඩ එහිවස්විසුබව සැකහැර ද නයුතු.

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 4 | 2 | පෞණ්ණී | පෞර්ණී |
| ,, | 6 | අපරජ්ජුති | අපරජ්ජුකි |
| ,, | 27 | එලඹිම | එලඹීම |
| ,, | 31 | විසඳිය | විසඳීය |

ප්‍රථම භාගයයි.

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 6 | 4 | පෞණ්ණී | පෞර්ණී |
| 7 | 13 | නිතිසත්‍ය | නීතිසත්‍ය |
| ,, | 15 | ශකාබ්ද | ගතාබ්ද |
| 8 | 1 | වසසුප | වසසූප |
| 9 | 33 | ගුතාසස | භූතාසස |
| 10 | 9 | සමන්නා ගතවූ | සමන්වා ගතවූ |

ද්විතීය භාගයයි.

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 14 | 7 | අනුකකඩ ඩිතාව | අනුකකාඩි තාව |

තෘතීය භාගයයි.

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 18 | 15 | චඤ | චාඤ |
| 20 | 22 | වස්වස | වස්වසා |
| ,, | 23 | කඩිතය | කඩීතග |
| ,, | 27 | පාඤ්තතියං | දුක්කටං |
| ,, | 33 | ශාරිපුත්‍ර | ශාරීපුත්‍ර |
| 21 | 2 | ශාරිපුත්‍ර | ශාරීපුත්‍ර |
| ,, | 9 | විවිධවිවිධ | විධිදෑවිවිධ |
| 22 | 24 | 1818 | 1918 |

චතුර්ථ භාගයයි.

---

## අ භි මා ස ම ණ්ඩ ල යේ
### ශුද්ධපත්‍රය,

—o—

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 17 | ලජ්ජ් | ලජ්ජී |
| 3 | 7 | මැවෙවුයේය | මැවෙව්යේය |
| ,, | 9 | සුරීයො | සූරියො |
| ,, | 14 | සමීඩික | සම්ඩික |
| ,, | 26 | රතනාපුරං | රතනපුරං |
| ,, | 30 | ජිනසාසනසස | ජිනසාසනසස |
| 4 | 8 | චෙතිති | චෙතියංති |
| ,, | 13 | අපචෙසෙතිවා | අපචෙසෙත්වා |
| ,, | 14 | සඞං | සඞං |
| ,, | 27 | සිරිබෙතත | සිරිබෙතත |
| ,, | ,, | පසු | පසු |
| 5 | 4 | චාසිහු | චාසීහු |
| ,, | 13 | පිහිටවූයේය | පිහිටවූයේය |
| ,, | 21 | ලජ්ජ් | ලජ්ජී |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| ,, | 29 | අධීක | අධික |
| ,, | 32 | බෙ | වෙ |
| ,, | ,, | අඩ | අඪ |
| 6 | 5 | සිරි | සිරි |
| ,, | 9 | අධිපතී | අධිපති |
| ,, | 23 | කෙරෙව්යේය | කෙරෙව්යේය. |
| ,, | ,, | ලඤජය | ලජ්ජය |
| 7 | 6 | වස්සික | වස්සික |
| ,, | ,, | පබ්බජිත්වා | පබ්බජිත්වා |
| ,, | 34 | දූඩකොට | දූඩිකොට් |
| 8 | 2 | ජපපපටාචාරී | ජපපටාචායරී |
| ,, | 3 | දූඩිකොට | දූඩිකොට |
| ,, | 21 | එාල් | එාල් |

ප්‍රථම භාගයයි.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 9 | 1 | වීනයා | විනයා |
| ,, | 27 | නොකලේය. | නොකලේය. |
| 10 | 25 | අඩාරසාධි | අඩාරසාධි |
| ,, | 28 | දුතිගාසාලභී | දුතියාසාලභී |
| ,, | 36 | සංසංදිත්වා | ..සංදිත්වා |
| 11 | 1 | අධිමාසති | අධිමාසාති |
| ,, | 30 | නගමන | නිගමන |

ද්විතීය භාගයයි.


| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 12 | 18 | දීමෙන් | දීමෙන් |
| ,, | 35 | කාලමහා | කාලමහා |
| 13 | 24 | කින්ද | වකින්ද |
| 15 | 18 | ලිත්වල | ලිත්වල |
| 16 | 16 | පෙ.ණිණි | පෞර්ණී |
| ,, | 22 | ඊලග | ඊලග |
| ,, | 28 | කෂ්ණපක්ෂ | කෘෂ්ණපක්ෂ |
| 17 | 11 | කිසිවක් | ඒ කිසිවක් |
| 18 | 26 | ධිමතාළ | ධිකමාස |
| ,, | 29 | භායනමහි | භායනමහි |

තෘතීය භාගයයි.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 19 | 34 | දිනයෙහි | දිනයෙහි |
| 20 | 24 | ශාත්‍රාගම | ශාස්ත්‍රාගම |
| 21 | 16 | බව | බව මෙසින්ද |
| ,, | 22 | විසු | වීසු |

චතුර්ථ භාගයයි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු